

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2020

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

இலங்கை அரச மருந்தாக்கற் பொருட்கள் உற்பத்திக் கூட்டுத்தாபனம்

**State Pharmaceuticals Manufacturing Corporation of Sri Lanka**

## සමරු ඵලකයේ සටහන

අත්‍යවශ්‍ය ඖෂධ නිපදවීම සඳහා වූ මෙම ඖෂධ සංයෝග මධ්‍යස්ථානය ශ්‍රී - ලංකා ජපාන මිත්‍රත්වයේ සංකේතයක් ලෙසින් ජපන් රජය විසින් ශ්‍රී - ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත කරන ලද පරිත්‍යාගයකි.

1987

## நுழைவாயிலில் இருக்கும் பதக்கப் பலகை

இம் முக்கியமான மருந்துகள் தயாரிக்கும் மருந்தாக்கல் கலவைகள் நிலையம் யப்பான்
நாட்டிற்கும் இலங்கை சனநாயக சோசலிசக் குடியரசிற்கும்
இடையே இருக்கும் நட்புறவு மற்றும் ஒருமைப்பாட்டின் அடையாளமாக
யப்பான் நாட்டினால்
இலங்கை சனநாயக சோசலிசக் குடியரசிற்கு வழங்கப்பட்ட நன்கொடையாகும்.
1987

## Plaque at the Entrance

This Pharmaceuticals Formulation Centre for the essential drugs is an outright gift by the
Government of Japan to the Democratic Socialist Republic of Sri Lanka as a
token of friendship and co-operation between Japan & the
Democratic Socialist Republic of Sri Lanka.
1987

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

# වාර්ෂික වාර්තාව 2020

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

# අලුත් රටට
# අලුත් බෙහෙත්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපති
ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ
සෞභාග්‍යයේ දැක්ම
ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින්
දේශීය ඖෂධ නිෂ්පාදනය
වැඩි කිරීමේ ඉදිරි පියවරක් ලෙස
මසකට වරක් නව ඖෂධ වර්ගයක්
වෙළඳපොලට ඉදිරිපත් කරන ලදී.









CA

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA
INCORPORATED BY ACT NO.23 OF 1959

APFA

ASSOCIATION OF PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA
(Public Sector Wing of CA Sri Lanka)

**Best Annual Reports and Accounts Awards for Public Sector - 2019**

Public Sector - Statutory Boards Category

**CERTIFICATE OF COMPLIANCE**

**AWARDED TO**

**State Pharmaceuticals Manufacturing Corporation**

On 29th December 2021 in Colombo

By The
Association of Public Finance Accountants of
Sri Lanka ( APFASL), the Public Sector Wing of
CA Sri Lanka

**V. Kanagasabapathy**
PRESIDENT, APFASL

**Asela Athapathu**
SECRETARY, APFASL

ASSOCIATION OF PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA

# පටුන


| | |
|---|---|
| අපගේ දර්ශනය සහ මෙහෙවර | 3 |
| ආයතනික තොරතුරු | 5 |
| රා. ඔෟ. නි. සං. පිහිටුවීම සහ මූලික අරමුණු | 6 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | 7 |
| අධ්‍යක්‍ෂවරු | 9 |
| අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව | 11 |
| විගණන කමිටු වාර්තාව | 13 |
| ආයතනික පාලන වාර්තාව | 14 |
| අපගේ නිපැයුම් | 16 |
| අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව | 17 |
| ආදයම් ප්‍රකාශය | 20 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 21 |
| ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 22 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 23 |
| ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති | 24 |
| ගිණුම් පිළිබඳ සටහන් | 33 |
| විගණකාධිපති වාර්තාව | 44 |
| 2020 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස | 55 |
| ප්‍රස්ථාරාත්මක සමාලෝචනය | 59 |
| පසුගිය වසර 10 ක වැදගත් මූල්‍ය විස්තර | 61 |

# අපගේ දර්ශනය

ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති

ඖෂධ නිමැවුම්

නිෂ්පාදනය හා අලෙවිකරණය කරන

දකුණු ආසියාවේ ඇති

ආදර්ශමත් ආයතනයක් බවට පත්වීම

# අපගේ මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල

සඳහා වඩා ආරක්ෂිත, ප්‍රත්‍යක්ෂ

හා

පහසු මිලකට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව

ඖෂධ නිෂ්පාදනය කිරීම

# ආයතනික තොරතුරු

### ආයතනයේ නාමය
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

### නෛතික තත්වය
1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වසරේ දී පිහිටුවන ලදී

### සංස්ථාපිත කළ දිනය
1987 ජූනි මස 04

### ලියාපදිංචි කාර්යාලය
අංක 11. ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන. ශ්‍රී ලංකාව.

### අධ්‍යක්ෂ මණ්ඩලය

**වෛද්‍ය පී. පී. ජී. පී. යූ. ඉන්ද්‍රවංස**
සභාපති

**කේ. එම්. එස්. පී. හේරත් මහතා**
කළමණාකාර අධ්‍යක්ෂ

**වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන**
අධ්‍යක්ෂ

**එස් ඒ. සී කුලතිලක මිය**
අධ්‍යක්ෂ

**පී චමින්ද වික්‍රමරත්න මහතා**
අධ්‍යක්ෂ

**එච් ඒ. කමල් පුෂ්පකුමාර මහතා**
අධ්‍යක්ෂ (2020.10.29 දක්වා)

### විගණකවරු
විගණකාධිපති, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

### බැංකු
ලංකා බැංකුව | මහජන බැංකුව | ජාතික ඉතිරි කිරීමේ බැංකුව

### කළමනාකරණ කමිටුව

**එස්.ඩබ්. ජයසුන්දර**
සාමාන්‍යාධිකාරිණී

**ඒ.ජී.ද.එස්.අතුරලිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මූල්‍ය)

**එස්.පී.ජයවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන)

**ආර්.එම්.ආර්.එම්.රණසිංහ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(වට්ටෝරු සහ පර්යේෂණ හා සංවර්ධන)
වැඩ බලන

**පී.ඩී. ජයසුන්දර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

**ආර්. ධර්මදාස**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සැලසුම් සහ ප්‍රසම්පාදන)

**වී.පී. මුතුකුඩ**
කළමනාකාර (නිෂ්පාදන) (2020 නොවැම්බර් දක්වා)

**එච්.කේ.පී. ඒ. සේනාධීර**
කළමනාකාර (තත්ව පාලන)

**ඩී.එච්.ජේ. ගුණවර්ධන**
කළමනාකාර (ඉංජිනේරු)

**වී.ජේ. බණ්ඩාරවත්ත**
අභ්‍යන්තර විගණක

**සී.ඩී. මගිනආරච්චි**
කළමනාකාරිණී (මානව සම්පත්)

**ඒ.සී.පී. ආනන්ද කුමාර**
කළමනාකාරිණී
(සැලසුම් සහ ප්‍රසම්පාදන)

**අමිල නුවන් හේවාගම**
කළමනාකාර (නිෂ්පාදන)

**ඒ.එම්.ටී.පී. කුලසේකර**
කළමනාකාර (අලෙවි ප්‍රවර්ධන)

**පී. දන්තනාරායන**
කළමනාකාර (නිෂ්පාදන)

**ජේ.එම්.එස්. ජයසුන්දර**
කළමනාකාර (මූල්‍ය)

**බී.වී.එච්.පී.එස්. කුමාර**
කළමනාකාර (ඉංජිනේරු)

**ඒ.පී.එම්. වික්‍රමනායක**
කළමනාකාර (නිෂ්පාදන)

**එම්. බෙනරගම**
කළමනාකාර (ඉංජිනේරු)

# රා.ඖ.නි.සං පිහිටුවීම සහ මූලික අරමුණු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපනය කර ඇත.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඖෂධ වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමෙහි 33 වසරක් සම්පූර්ණ කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන මාලාව පෙති සහ කරල් නිෂ්පාදන 81 කින් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ මෙයින් නිෂ්පාදන 55 ක් ක්‍රියාකාරී ලෙසම සංයෝජනය කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනයෙහි නියැලී සිටින එකම රාජ්‍ය සංස්ථාවයි.

ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්

1. තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ නැවත ඇසුරුම් කිරීම

2. පාලිත සමාගම් නිර්මාණය කිරීම

3. අනාගත ආයෝජකයන් සමග ජාත්‍යන්තර ගිවිසුම්වලට ඇතුළත් වීම

4. ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහය ලබා දීම

5. ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම සහ


6. සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මඟින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මඟින් නිපදවන ලද ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම

වෙළඳපලට මුදා හරිනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) සහ එක්සත් ජනපද ෆාමකෝපියා (USP) නියමයන්ට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) අභ්‍යන්තර පිරිවිතරයන්ට ද අනුකූල වේ.


වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) නියමයන් සහ කාර්යය පටිපාටි ක්‍රියාවේ යොදවන ආකාරය පිළිබඳව අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය සහ කම්හල් පිරික්සුම හරහා නිරීක්ෂණය සිදු කරනු ලැබේ.

# සභාපතිතුමාගේ පණිවුඩය








අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා විගණකාධිපති වාර්තාව ඇතුළත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.




පොදු ජනතාවට ගුණාත්මක, ඵලදායි හා ආරක්ෂාකාරී ඖෂධ නිපදවීමේ ඇප කැපවීමද සහිතව 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ 1987 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ විශාලතම හා ප්‍රමුඛතම ඖෂධ නිෂ්පාදකයා වෙයි. මේ වන විට මෙම සංස්ථාව ඖෂධ නාම යටතේ පුළුල් පරාසයක් ආවරණය කරමින් ඖෂධ වර්ග 81ක් නිෂ්පාදනය කරයි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) එක්සත් ජනපද ෆාමකෝපියා (USP) හා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා ප්‍රමිතිවලට අනුව අවශ්‍ය ගුණාත්මකතාවය සපුරා ඇත. කාලීන යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) රෙගුලාසි හා කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය හා කම්හල් පරීක්ෂාව හරහා නිති නිරීක්ෂණය කරනු ලැබේ.




ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනාගාරය නවීන ජපන්, ජර්මානු හා කොරියානු යන්ත්‍රවලින් සමන්විතය. නිෂ්පාදනාගාරය අතිශයින් පිරිසිදු වාතාවරණයක් පවත්වාගෙන යන අතර එය ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) නියමයන්ට අනුකූල වෙයි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින වෛද්‍යවරුන්, ඖෂධවේදීන් හා වෙනත් වෘත්තීයවේදීන් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන අගය කරනු හා වඩා ප්‍රිය කරනු ලබයි. අපගේ සාර්ථකත්වයට තුඩු දෙන කරුණ වන්නේ ගුණාත්මක ඖෂධ නිපැයුම් නිෂ්පාදකයකු වශයෙන් වූ අපගේ කීර්තියයි.



## කාර්යසාධනය

2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව රුපියල් මිලියන 1,017 ක වාර්තාගත බදු පසු ශුද්ධ ලාභයක් ලබාගෙන ඇත.

## නිෂ්පාදන ප්‍රතිදානය

සංස්ථාවේ වැඩිම වාර්තාගත නිෂ්පාදන ප්‍රතිදානය 2020 වර්ෂයේදී පෙති/කරල් ඒකක මිලියන 3015 ක් විය.

## පිරිවැටුම

2020 වර්ෂය සඳහා වූ මුළු පිරිවැටුම රුපියල් මිලියන 7,647 ක් වූ අතර එය සංස්ථාව ආරම්භ කළ පසු ඉහළම පිරිවැටුම විය. මුළු අලෙවියෙන් 86.81% ක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD) වෙත වූ අතර ඉතිරිය 13.1% ක් අප වෙත ලියාපදිංචිව සිටින බෙදාහරින්නන් වෙත හා 0.09% ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) වෙත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මහා භාණ්ඩාගාරය වෙතින් කිසිදු සහායකින් තොරව සිය සම්පත් වලින් ලාභ ඉපැයීමට සමත් වී ඇති බව සනිටුහන් කරනුයේ ඉතා සතුටිනි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වශයෙන් වූ සිය වගකීම ඉටුකරමින් 2020 වර්ෂයේදී දායකත්වය වශයෙන් රුපියල් මිලියන 24 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ගෙවා ඇත.

## සංවර්ධන කාර්යය

### කම්හල සංවර්ධනය

2020 වර්ෂය තුල පෙති හා කරල් මිලියන 3015ක් නිෂ්පාදනය කර ඇත.

### නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමන් විසින් හෝමෝන පෙති නිෂ්පාදනය සඳහා නව කලාපයක් විවෘත කරන ලද අතර එහි ප්‍රථම නිෂ්පාදනය තයරොක්සින් පෙති විය. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව JICA ව්‍යාපෘතිය හරහා නිෂ්පාදන ධාරිතාවය පෙති/කරල් මිලියන 3000ට ළඟා වී ඇත.

### පර්යේෂණ හා වට්ටෝරු සංවර්ධනය

2020 වර්ෂය තුළ නිෂ්පාදන 07ක් සඳහා ලියාපදිංචි කිරීමේ සහතික ලබාගෙන ඇති අතර නව නිපැයුම් ලෙස ඖෂධ වර්ග 04ක් සාර්ථකව නිපැයුම් කොට වෙළඳපොලට හඳුන්වා දී ඇත.

## මානව සම්පත් සංවර්ධනය සහ සුභසාධනය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ කාර්යක්ෂම හා සුමට ක්‍රියාකාරිත්වය උදෙසා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මගපෙන්වීම යටතේ රැකියාස්ථ පුහුණුවේ යෙදී සිටින පුහුණුලාභීන් 07 දෙනෙක් සහ කොන්ත්‍රාත් පදනම මත යෙදවූ 01 ක් ද ඇතුළුව සේවක සේවිකාවන් 291ක් 2020.12.31 දින වන විට සේවයේ යෙදී සිටියහ.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සේවක සේවිකාවන් විසින් ඉල්ලනු ලැබූ මූලික සුභසාධන පහසුකම් සැපයීම මෙම වර්ෂයේදීද සිදු කළේය.

කොවිඩ් 19 වෛරසයෙන් ආසාධිත වූ සේවකයින් සියලු පහසුකම් සහිත කොවිඩ් නිවාරණ මධ්‍යස්ථාන වෙත යවමින් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සපයන ලදී..

## උපායමාර්ග හා ඉඩප්‍රස්ථා

අපගේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD), රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) පෞද්ගලික ඔසුසල් හා වෛද්‍ය වෘත්තිකයින් සඳහා අවශ්‍ය කෙරෙන ඖෂධ ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීමයි.

රා. ඖ . නි. සං. විසින් හොරණ මිල්ලෑව ප්‍රදේශයේ නව කර්මාන්තශාලාවක් පිහිටුවීම තුලින් සිය නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමට අපේක්ෂා කරයි.

- විකලාංග උපකරණ සඳහා නිෂ්පාදනාගාරය
- පිළිකා සඳහා ඖෂධ නිෂ්පාදනාගාරය
- මුඛ සණ ඖෂධ සඳහා සාමාන්‍ය ඖෂධ නිෂ්පාදනාගාරය

මෙසේ පිහිටුවීමට බලාපොරොත්තු වේ.

මෙම පුළුල් කිරීම අපට නිෂ්පාදනය දියුණු කිරීමට, නිපැයුම් මාලාව ව්‍යාප්ත කිරීමට, නව රැකියා අවස්ථා ජනනය කිරීමට, තාක්ෂණික දැනුම නංවා ගැනීමට, විකිණුම් ආදායම වැඩි කර ගැනීමට හා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ව්‍යාපාරික ප්‍රතිරූපය නිර්මාණය කර ගැනීමට ඉවහල් වනු ඇත.

## තුති පළකිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයේ උන්නතිය උදෙසා සිය අඛණ්ඩ කැපවීම වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිමි. එමෙන්ම ගරු සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය සහ ගරු ඖෂධ නිෂ්පාදනය, සැපයුම් සහ නියාමනය පිළිබඳ රාජ්‍ය ඇමති මහාචාර්ය චන්න ජයසුමන මැතිතුමා විසින් ලබා දෙන ලද අගනා සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් මාගේ කෘතඥතාව පළ කරමි. තවද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ මේජර් ජනරාල් සංජීව මුණසිංහ මහතා සහ ඖෂධ නිෂ්පාදනය, සැපයුම් සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කේ ආර් උඩුවාවල මහතා ඇතුළු සියළු නිලධාරීන් විසින් ලබා දෙන ලද මගපෙන්වීමද අපි අගය කරමු. එමෙන්ම මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තුවල නිලධාරීන් විසින් ලබා දෙන ලද දායකත්වය අපි මහත්සේ අගය කරමු.

මෙම සංස්ථාවේ සාර්ථකත්වය උදෙසා මනා දායකත්වයක් ලබා දුන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) වෛද්‍ය සැපයුම් අංශය (MSD) ඔසුසල් හා වෛද්‍ය වෘත්තිකයින් අප සමග උත්කෘෂ්ට සබඳතාවක් පවත්වා ගෙන ගිය බව කෘතඥතා පූර්වකව සනිටුහන් කිරීම සතුටකි.

2020 වර්ෂයේ දී සාධනීය ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමෙහිලා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂතුමා, සාමාන්‍යාධිකාරීතුමිය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, කළමනාකාරවරුන්, විධායක කාර්ය මණ්ඩලය සහ සියලුම මට්ටම්වල සේවකයින් විසින් දක්වන ලද කැපවීම අපි මහත් සේ අගය කරමු. අවසන් වශයෙන්, සංස්ථාව සාර්ථකත්වය කරා මෙහෙයවීමෙහිලා සිය අගනා දායකත්වය හා මගපෙන්වීම ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පුද කර සිටිමි.

**වෛද්‍ය පී. පී. ජී. පී. යූ. ඉන්ද්‍රවංශ**
**සභාපති**

**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**2021 පෙබරවාරි 28 වැනි දින**

# අධ්‍යක්ෂවරු

## වෛද්‍ය පී පී ජී පී උත්පල ඉන්ද්‍රවංස - සභාපති

වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස මහතා වෛද්‍යවරයෙක් වන අතර රුසියාවේ ප්‍රමුඛපෙළේ වෛද්‍ය විද්‍යාලයක් වන සෙනෝව් -වන් වෛද්‍ය විද්‍යාලයෙහි (Medical Academy of Sechenov - one) අධ්‍යාපනය හදාරා ඇත. ඔහුගේ සීමාවසික පුහුණුව අවසන් කරන ලද්දේ පොළොන්නරුව මහ රෝහලේය.

පුලස්තිපුර ග්‍රාමීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී ලෙස කටයුතු කරමින් සිටින කාලයේදී 2007 වසරේ 5S ඵලදායීතා පළාත් සම්මානය ලබා ගැනීමට ඔහු පුරෝගාමී වී ඇත, එම කාලසීමාවේදීම වෛද්‍ය කාණ්ඩයෙන් සහ රෝහල් කාණ්ඩයෙන් විශිෂ්ඨ සෞඛ්‍ය සම්මානය ද ඔවුන් විසින් දිනාගෙන ඇත. ඔහු 2009 වසරේ පටන් ජාතික රෝහලේ, විකලාංග ඒකකයේ හදිසි අනතුරු සේවා අංශයේ සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් 2019 වසරේ පටන් සේවය කරයි.

## සමන් හේරත් මහතා - කළමනාකාර අධ්‍යක්ෂ

සමන් හේරත් මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූයේ 2000 ජනවාරි මාසයේ සිටයි. සමන් හේරත් මහතා වසර 35ක පළපුරුද්දක් සහිත බැංකු නිලධාරියෙකි. බැංකු හා සම්බන්ධ ඔහුගේ වෘත්තීය ගමන් මග 1981 වසරේ කොමර්ෂල් බැංකුවෙන් ආරම්භ කරන ලදී. ඔහු, පසුව 1987 වසරේදී සම්පත් බැංකුව හා සම්බන්ධ වන්නේ මූල්‍ය අංශයේ විධායකවරයා වශයෙනි. හේරත් මහතා බැංකු ධූරාවලියේ ඉහළටම යන්නේ 2015 ජූනි මාසයේදී ඔහු විශ්‍රාම ගන්නා ලද ආයතනික බැංකුකරණයේ ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි යන තනතුර දක්වා ගමන් කිරීමෙනි. ප්‍රතිඵල-ඉලක්ක කර ගත් පුද්ගලයෙක් වන හේරත් මහතා සම්පත් බැංකුවේ සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබා දී ඇත.

ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකාර ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (FCMA, UK) සහ වරලත් ගෝලීය කළමනාකාර ගණකාධිකාරිවරුන්ගේ (CGMA) සාමාජිකයෙකි. හේරත් මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ද සාමාජිකයෙක් වන අතර බැංකුකරුවන්ගේ ආයතනයෙන් ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් වත්කම් සහ වගකීම් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රයක් යනාදී වශයෙන් සුදුසුකම් රැසක් අත්කර ගෙන ඇති අතර සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලය වැනි ආයතන මගින් පවත්වන ලද සාමාන්‍ය සහ ක්‍රමෝපායික කළමනාකරණය පිළිබඳ පාඨමාලා ගණනාවක් ද අවසන් කර ඇත.

## විද්‍යාජෝති චන්ද්‍රනාත් විජේසිරිවර්ධන - අධ්‍යක්ෂ

විශේෂඥ වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන රාජ්‍ය සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ වසර 33කට වැඩි පළපුරුද්දක් සහිත අයෙක් වන අතර ඔහු වෛද්‍ය විද්‍යාව සඳහා ප්‍රධාන පරීක්ෂක, MCQ ප්‍රධාන සමූහයේ සභාපති, AAAED කමිටුවේ සාමාජික සහ 2005 වසරේදී ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාපති වශයෙන් කටයුතු කර ඇත.

ඔහු වර්තමානයේ පූර්ණකාලීනව පෞද්ගලික සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කරයි. මේ වන විට දිවයින පුරා භාවිතා වන සායනික පුහුණු මාර්ගෝපදේශ ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය හරහා හඳුන්වාදීමට වෛද්‍ය විජේසිරිවර්ධන පුරෝගාමී වී ඇත. ඔහුගේ නමට පළ වන ජාතික මෙන්ම ජාත්‍යන්තර පලකිරීම් ගණනාවක් අතරේ, 2000 වසරේදී ඔහුගේ සායනික පර්යේෂණය සඳහා ජනාධිපති සම්මානය වෛද්‍ය විජේසිරිවර්ධන විසින් දිනා ගන්නා ලදී. එමෙන්ම රෝයල් ඔස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් ෆිසීෂියන්ස් (The Royal Australian College of Physicians) සහ දකුණු අප්‍රිකාවේ කොලේජස් ඔෆ් මෙඩිසින් (Colleges of Medicine in South Africa) මගින් ගෞරව සාමාජිකත්වය පිරිනමන ලදී.

ඔහු MBBS (කොළඹ), MD (කොළඹ) සහ MRCP (UK) දරන අතර ඇමරිකානු වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි (American College of Physicians) සහ ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි (Ceylon College of Physicians) සාමාජිකයෙකි.

## එස්. ඒ. චන්ද්‍රිකා කුලතිලක මහත්මිය - අධ්‍යක්ෂ

එස්. ඒ. චන්ද්‍රිකා කුලතිලක මහත්මිය මේ වන විට කළමනාකාර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරිය වශයෙන් සේවය කරයි.

ඇය (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන්) වාණිජ උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත.

ඇය විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරියක වශයෙන් සේවය කර ඇති අතර තැපැල් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිණිය ලෙසද කටයුතු කර ඇත. තවද ඇය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂවරිය ලෙස ද කළමනාකාර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙසද සේවය කර ඇත. ඉන්දීය රාජ්‍යයේ අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කිරීම සම්බන්ධ වැඩමුළුවේදී ඇය සම්පත් දායිකාවක් විය.

## වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා

වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා වශයෙන් 2020 ජනවාරි පටන් සේවය කරන අතර ඔහුට SMI ඉන්ජිනියරින් පුද්ගලික සමාගමේ නිර්මාතෘ වශයෙන් ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ විසි වසරකට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු ජාතික තරුණ සේවා සභාවේ (2005-2008), මහජන කාර්ය සාධන මණ්ඩලය ජාතික චිත්‍රපට සංස්ථාවේ (2008-2010) සහ ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගමේ (2012-2015) අධ්‍යක්ෂවරයා ලෙස සේවය කර ඇත.

වර්තමානය වන විට ඔහු හරිත TV ජාල පුද්ගලික සමාගමේ සහ Ariike පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ තනතුර දරයි. ඊට අමතරව ඔහු ජාතික දුම්රිය කෞතුකාග ාර කමිටුවේ සාමාජිකයෙකි.

## එච්. ඒ. කමල් පුෂ්පකුමාර - අධ්‍යක්ෂ

කමල් පුෂ්පකුමාර මහතා වර්තමානය වන විට සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) වශයෙන් ක්‍රියා කරයි.

ඔහු 2019 සිට 2020 දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස සේවය කර ඇති අතර 2009 වසරේ පටන් විවිධ ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය ලේකම් ලෙස සේවය කර ඇත. මීට අමතරව ඔහු 1994 වසරේ පටන් රජයේ විවිධ තනතුරු දරා ඇත.

ඔහු කොළඹ SLIDA, ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජන සන්නිවේදන අමාත්‍යාංශය වැනි ආයතනවලින් පාඨමාලා හදාරා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිය විගණිත ගිණුම් වාර්තා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ගිණුම් වාර්තා පිටු 19-43 දක්වා ඇත.

### ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ නැවත ඇසුරුම් කිරීම
- පාලිත සමාගම් නිර්මාණය කිරීම
- අනාගත ආයෝජකයන් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට ඇතුළත් වීම
- ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහය ලබා දීම
- ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම සහ
- සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මඟින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මඟින් නිපදවන ලද ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම

### ව්‍යාපාර සමාලෝචනය

2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යයන් හි තත්වය පිළිබඳ තොරතුරු අඩංගු ශේෂ පත්‍රය 21 පිටුවේ දක්වා ඇත. අදාල මූල්‍ය වර්ෂයේ සංස්ථාවේ තක්සේරුව පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනයෙහි පිටු 07 සිට 08 දක්වා ඇත.

### පිරිවැටුම සහ ප්‍රතිඵල

2020 වර්ෂයේ පිරිවැටුම සහ ප්‍රථිඵල ඇතුලත් ආදායම් ප්‍රකාශය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය පිළිවෙලින් 20 සහ 22 පිටු වල දක්වා ඇත.

### අනාගත සංවර්ධන කාර්යයන්

ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනයෙහි පිටු අංක 07 සිට 08 දක්වා ඇත.

### පරිත්‍යාග

අදාල වර්ෂය තුල සංස්ථාව විසින් පරිත්‍යාග කිසිවක් ලබා දී නොමැත.

### දේපළ, පිරියත සහ උපකරණ

අදාල වර්ෂය තුළ ව්‍යාපාරයේ දේපළ, පිරියත සහ උපකරණ ඇතුලත් වාර්තා 38 පිටුවේ මූල්‍ය ප්‍රකාශයෙහි 10 වන සටහන මගින් දක්වා ඇත.

### ලාභාංශ / දායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලාභාංශ ලෙස රු මිලියන 24,000,000 ක දායකත්වයක් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට ගෙවා ඇත.

### සංචිත

මුළු සංචිත ප්‍රමාණය හා ඒවායේ සංයෝජනය ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මගින් 22 පිටුවෙහි දක්වා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. එක් අධ්‍යක්ෂවරයෙක් මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය නියෝජනය කරයි.

### නව අධ්‍යක්ෂ මණ්ඩලය

නව අධ්‍යක්ෂ මණ්ඩලය 2020 වර්ෂයේ ජනවාරි මස පත් කරන ලදි.

අදාළ කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04 ක් පැවැත්වුන අතර අදාල කාලපරිච්ඡේදය සඳහා සංස්ථාවේ කටයුතු සම්බන්ධ වගකීම සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ඇත.

| | |
|---|---|
| **වෛද්‍ය පී. පී. ජී. පී. යූ. ඉන්ද්‍රවංස** | - සභාපති |
| **කේ. එම්. එස්. පී. හේරත් මහතා** | - කළමනාකාර අධ්‍යක්ෂ |
| **වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන** | - අධ්‍යක්ෂ |
| **එස් ඒ. සී කුලතිලක මිය** | - අධ්‍යක්ෂ |
| **ජී චමින්ද වික්‍රමරත්න මහතා** | - අධ්‍යක්ෂ |
| **එච් ඒ. කමල් පුෂ්පකුමාර මහතා** | - අධ්‍යක්ෂ(2020.10.29 දක්වා) |

### ගිණුම් ප්‍රතිපත්ති

සංස්ථාව උපයෝගී කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 24 සිට 32 දක්වා පිටුවල ඇත.

### පරිසර සංරක්ෂණය

සිය ක්‍රියාකාරීත්වය තුළින් පරිසරයට අහිතකර ප්‍රතිඵලයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම සහ ඉහළම ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන අපගේ පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවට ලබා දීමෙන් ඔවුන්ට වාසිදායක ප්‍රතිඵලයක් ඇති කිරීම සංස්ථාවේ වගකීම වේ.

### ව්‍යවස්ථානුකූල ගෙවීම්

ශේෂ පත්‍ර දිනට රජයට හා සේවකයන්ට අදාල සියලුම ව්‍යවස්ථානුකූල ගෙවීම් කර තිබේ.

### ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන් හි සැකසීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයේ සිට සිදුවී නොමැත.

### අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශයන් මූලිකවම පිළියෙල කරන ලද්දේ අඛණ්ඩ පැවැත්ම යන සංකල්පයට අනුකූලවය. සංස්ථාව සතුව ප්‍රමාණවත් සම්පත් පවත්නා බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනාගත මෙහෙයුම් පිළිබඳව සෑහීමකට පත් වේ.

### විගණකවරුන් පත් කිරීම

1971 මූල්‍ය පනතේ ප්‍රකාරව විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණක වන අතර, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් කරන ලදී.

**වෛද්‍ය පී. පී. ජී. පී. යූ. ඉන්ද්‍රවංස**

**සභාපති**

**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**

# විගණන කමිටු වාර්තාව - 2020

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

2010/12/14 දිනැති අංක පීඊඩී 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව විගණන කමිටුව පිහිටුවා ඇත.

ඉහත චක්‍රලේඛයට අනුව 'අදාළ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කර ගැනීම සඳහා සහය වීමට, රජය විසින් නිකුත් කරන ලද අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට ඇති අනුකූලතාවය විමර්ශනය කිරීම හා අනුකූල නොවන අවස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශයන් ඉදිරිපත් කිරීමට, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි, පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ (COPE) නිර්දේශයන් විමර්ශනය කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීමට විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය විය යුතු වේ'.

වර්ෂය තුළදී සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත වූ විගණන කමිටුවෙහි සභාපතිත්වය දරනු ලැබුවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරිය විසිනි.

උක්ත චක්‍රලේඛය අනුව ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙක් නිරීක්ෂකයෙකු ලෙස මෙම රැස්වීම්වලට සහභාගි වී ඇති අතර සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකදවරිය එම අමාත්‍යාංශයේ නිරීක්ෂකයකු ලෙස මෙම රැස්වීම් වලට සහභාගී වී ඇත.

විගණන කමිටුවේ ආරාධනය මත රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂකවරයා විගණන කමිටු රැස්වීම් වලට සහභාගී වූහ.

### 2020 මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් දෙකක් (02) පවත්වා ඇත.

**2020 වසර තුළ කමිටුව විසින්,**

- 2018 සැප්තැම්බර් මස සිට 2020 මැයි මස දක්වා නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පිළිතුරු අවධානයට යොමු කර ඒවා නිවැරදි කිරීම සඳහා අදාළ කළමණාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සැලකිල්ලට ලක් කර ඇත.
- සංස්ථාවේ කාර්යයන් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා මුදල්, විකුණුම්, ගෙවීම්, ණයගැතියන්, දිගු කාලයක් භාවිතයට නොගත් අමු ද්‍රව්‍ය, කොන්ත්‍රාත් පරිපාලනය, ඇසුරුම් ද්‍රව්‍ය හා ස්ථාවර වත්කම් මිලදී ගැනීම් යන ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලන පද්ධති කිහිපයක ප්‍රමාණාත්මකභාවය පිළිබඳව විමර්ශනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ සම්බන්ධයෙන්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ගෙන ඇති පසුවිපරම් කටයුතු පිළිබඳව සැලකිල්ලට ගෙන ඇත.
- 2019 වර්ෂයට අදාළව විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන විමසුම් සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් ලබා දුන් පිළිතුරු සැලකිල්ලට ගෙන ඇත.
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ මිල කමිටුව විසින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන වල මිල ගණන් තීරණය කිරීමේ දී සංස්ථාව මුහුණදෙන අපහසුතා පිළිබඳව සැලකිල්ලට ගෙන සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.
- අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන ලද ක්ෂේත්‍ර වලට අදාළව ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතියෙන් (ERP) ලබා ගන්නා තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳ සැලකිල්ලට ගෙන ඇත.
- 2017 හා 2018 වසර වලට අදාළ විගණකාධිපති වාර්තාවන් විමර්ශනය කිරීම හා පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩු පාඩු, නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවන අවස්ථාල නිෂ්පාදනය, විකුණුම්, කාර්ය මණ්ඩල පරිපාලනය, ප්‍රසම්පාදනය, කොන්ත්‍රාත් ක්‍රියාවලිය හා බද්ධ ව්‍යාපාර ගිවිසුම් සම්බන්ධ ගැටලු නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සැලකිල්ලට ගෙන ඇත.
- රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට අදාළව අවශ්‍ය තොරතුරු සලකා බලා සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

විගණන කමිටුවේ කාර්ය පැවරුම් නියමයන් සියලු ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධයෙන් අනුකූල වූ බව කමිටුවේ මතයයි.

විගණන කමිටු සාමාජිකයන්

| | | | | |
|---|---|---|---|---|
| එස් ඒ සී කුලතිලක | - | සභාපතිනි | - | අධ්‍යක්ෂ - රා ඖ නි ස / අධ්‍යක්ෂ ජනරාල් - කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව |
| එච් ඒ කමල් පුෂ්පකුමාර | - | සාමාජික | - | අධ්‍යක්ෂ - රා ඖ නි ස / සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත |
| වී ජී සී වික්‍රමරත්න | - | සාමාජික | - | අධ්‍යක්ෂ - රා ඖ නි ස |

**එස් ඒ සී කුලතිලක**
**විගණන කමිටුවේ සභාපතිනි**
**2021.09.03**

# ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මගින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්, රජය සහ ප්‍රජාව) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණ, ඖෂධවේද, වෛද්‍ය විද්‍යාව, අලෙවිකරණය, මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ කළමණාකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු හතර දෙනෙකු ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටෙකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

සමාලෝචනයට ලක් වූ කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පහක් පැවැත්වුණි.

## කළමනාකරණ කමිටුව

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරි, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ සහ උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මගින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

## විගණන කමිටුව

"යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතරදෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධක්ෂවරයා කමිටුවේ සභාපති වේ. සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම් විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලැබේ. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන අතර එය විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ.

අදාල කාල පරිච්ඡේදය තුළදී විගණන කමිටු රැස්වීම් දෙකක් පැවැත්වුණි. විගණන කමිටුවේ වාර්තාව පිටු අංක 13 හි දක්වා ඇත.

## ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම

ජනතාව වෙනුවෙන් රජය විසින් පොදු ව්‍යාපාර පිහිටුවීම, අයිතිය පවත්වා ගෙන යාම සහ මෙහෙයවීම කරනු ලැබේ. එම නිසා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම අමාත්‍යාංශ වලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරී බලය ජනතා නියෝජිතයින් නියෝජනය කරන්නා වූ පාර්ලිමේන්තුව සතුව පවතින බව ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය විසින් පිළිගෙන ඇත.

ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

පොදු ව්‍යාපාරයක් ලෙස සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වග කියනු ලැබේ.

### වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත පිහිටුවා සකසා ඇත.

අධ්‍යක්ෂ වේතන සහ අනෙකුත් දීමනා මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන රාජ්‍ය සංස්ථා වලට අදාල වේතන හා දීමනා සඳහා වන චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

සේවක වේතන රාජ්‍ය පරිපාලන වැටුප් තලයන් පාදක කර ගනිමින් සංස්ථාව විසින් පිළියෙල කරන ලද වැටුප්තලයන් අනුව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ඇතිව ගෙවනු ලැබේ. කාර්යසාධනය මත සෘජුවම අගය කිරීමක් ලෙස කාර්යසාධන දිරිදීමනාව හඳුනාගෙන ඇත.

### අභ්‍යන්තර පාලනය

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම, වාර්තා කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම් කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ව පාලන, නඩත්තු, මූල්‍ය, සැලසුම්, වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙති.

සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරී වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා සෘජුවම වාර්තා කරයි.

සාමාන්‍යාධිකාරී, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. අභ්‍යන්තර විගණන කාර්යය මගින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මගින් අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තවදුරටත් තහවුරු කෙරේ.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය තරගකාරී ටෙන්ඩර් පටිපාටිය මගින් සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය රැකීම තුලින් සැපයුම්කරුවන්ට මෙමගින් සමාන අවස්ථා ද ලැබේ.

ප්‍රාග්ධන අයවැය ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට හා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

# අපගේ නිපැයුම් වර්ග

අපගේ එක් එක් නිපැයුම් වර්ග අනුව නිෂ්පාදිත පෙති හා කරල් සංඛ්‍යාව

| නිපැයුම් වර්ග | ප්‍රමාණය මිලියන වලින් | නිපැයුම් වර්ග | ප්‍රමාණය මිලියන වලින් |
|---|---|---|---|
| ඇමොක්සිසිලින් පෙති USP මි.ග්‍රෑ 125 | 15.750 | ක්ලෝරකුයින් ෆොස්ෆෙට් පෙති බී.පී මිග්‍රෑ 500 | 0.055 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 250 | 128.800 | ෆැමොටිඩීන් පෙති USP මි.ග්‍රෑ 20 | 97.200 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 500 | 42.000 | ෆෲසෙමයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 67.125 |
| ඇස්කෝබික් අම්ලය පෙති BP මි.ග්‍රෑ 100 | 21.600 | ෆෝලික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 1 | 12.000 |
| ඇටෝවාස්ටටින් පෙති BP මි.ග්‍රෑ 10 | 298.500 | ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 96.000 |
| ඇටෝවාස්ටටින් පෙති BP මි.ග්‍රෑ 20 | 1.200 | ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 80 | 147.000 |
| ඇටනොලොල් පෙති BP මි.ග්‍රෑ 50 | 17.000 | ඉන්ඩොමෙතසින් කරල් BP මි.ග්‍රෑ 25 | 3.500 |
| බෙන්සෙක්සෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 72.000 | ලොසාටන් පොටෑසියම් පෙති මි.ග්‍රෑ 50 | 271.402 |
| කාබමෙසපීන් පෙති BP මි.ග්‍රෑ 200 | 34.750 | මෙබෙන්ඩසෝල් පෙති USP මි.ග්‍රෑ 100 | 31.000 |
| සෙටිරිසින් පෙති මි.ග්‍රෑ 10 | 16.900 | මෙට්ෆෝමින් පෙති BP මි.ග්‍රෑ 500 | 43.781 |
| ක්ලැරිත්රොමයිසින් පෙති මි.ග්‍රෑ 250 | 16.200 | මෙට්‍රනයිඩසෝල් පෙති BP මි.ග්‍රෑ 200 | 9.894 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 250 | 45.850 | පැරසිටමෝල් පෙති BP මි.ග්‍රෑ 500 | 421.654 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 500 | 14.875 | ෆිනොක්සිමීතයිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 250 | 25.000 |
| සිප්‍රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 500 | 10.800 | ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 5 | 268.800 |
| සිප්‍රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 250 | 7.003 | ප්‍රොප්‍රනලෝල් පෙති BP මි.ග්‍රෑ 40 | 22.000 |
| සිමටිඩින් පෙති BP මි.ග්‍රෑ 200 | 4.160 | සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 213.600 |
| කොට්‍රිමොක්සසෝල් BP (වැඩිහිටි) | 3.750 | සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 4 | 24.000 |
| ඩොම්පෙරිඩොන් පෙති BP මි.ග්‍රෑ 10 | 136.500 | ස්පයිරනොලැක්ටෝන් පෙති USP මි.ග්‍රෑ 25 | 40.500 |
| ඩයික්ලෝෆෙනැක් සෝඩියම් පෙති USP මි.ග්‍රෑ 50 | 61.100 | තියෝෆිලීන් පෙති ER USP මි.ග්‍රෑ 125 | 21.350 |
| ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 60 | 19.052 | ට්‍රයිෆ්ලුවොපෙරසීන් HCl පෙති BP මි.ග්‍රෑ 5 | 15.750 |
| ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 30 | 32.214 | වෙරපමිල් පෙති BP මි.ග්‍රෑ 40 | 24.200 |
| ඩයිඑතයිල් කාබමසීන් පෙති BP මි.ග්‍රෑ 50 | 9.000 | විටමින් බී පෙති CHF | 49.000 |
| එනලප්‍රිල් මැලියේට් පෙති මි.ග්‍රෑ 5 | 100.800 | | |

## ඉදිරියේදී නිපදවීමට අදහස්කර ඇති ඖෂධ - 2021

ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 1
මෙෆෙනමික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 500
ෆිනොක්සිමීතයිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 500
ඔමෙප්‍රසෝල් කරල් IP මි.ග්‍රෑ 20
ලොසාටන් පොටෑසියම් පෙති BP මි.ග්‍රෑ 25
ට්‍රයිමෙතොප්‍රිම් පෙති BP මි.ග්‍රෑ 200
නිමොඩිපින් පෙති BP මි.ග්‍රෑ 30
ඉබුප්‍රොෆේන් පෙති BP මි.ග්‍රෑ 200

ට්‍රැමඩොල් කරල් IP මි.ග්‍රෑ 50
රොසුවාස්ටටින් පෙති BP මි.ග්‍රෑ 30
ලෙවතයිරොක්සින් පෙති IP මයික්‍රො.ග්‍රෑ 10
බිසොප්‍රොලෝල් පෙති BP මි.ග්‍රෑ 5
ලොරටඩින් පෙති BP මි.ග්‍රෑ 10
මීතයිල් ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 4
ඇම්ලොඩිපින් බෙසිලේට් පෙති BP මි.ග්‍රෑ 5

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව

මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, පිටු අංක 44-54 හි ඇතුලත් විගණකාධිපති වාර්තාවේ සඳහන් විගණකවරයාගේ වගකීම තුලින් වෙනස් වේ.


1971 අංක 38 දරණ මුදල් පනතට අනුකුලව රාජ්‍ය සංස්ථා විසින් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සහ සංස්ථාවේ අනෙකුත් සියළුම ගනුදෙනු පිළිබඳ ගිණුම් වාර්තා සුදුසු පරිදි තබා ගත යුතුය. රාජ්‍ය සංස්ථා විසින් ගිණුම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සහ සංස්ථාවේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වු සංඛ්‍යානමය කරුණු, එකී ස්වරූපයන් හා එකී කරුණු ඇතුලත්ව පිළියෙල කළ යුතුය.

රජය සහ ආයතනයට සම්බන්ධ පාර්ශවයන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයට, ආයතනයේ භාරකාරීත්වය සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකුලව වගකීමක් හිමිව තිබෙන අතර සංස්ථාවේ මුල්‍ය තත්වය පිළිබඳ සාධාරණ නිවැරදි තාවයකින් යුක්තව හෙළිදරවු කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා සංස්ථාව තුළ තබා ගැනීමට ඔවුන වගකීමෙන් බැඳේ. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකුලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු කොට ඇති බවට සහ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුකුලව අවශ්‍ය තොරතුරු සපයා ඇති බවට සහ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති බව සහතික කළ යුතුය.

සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවරයන් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමක් ඇති අතර, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන, අභ්‍යන්තර සෝදිසි කිරීම්,මුල්‍යමය සමාලෝචනය සහ වංචා හා අක්‍රමිකතා අනාවරණය කර ගැනීම ඇතුළත් වූ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමස්ථාපනය කිරීම සඳහා සුදුසු සලකා බැලීම් කිරීමේ වගකීමද ඔවුන් සතුය.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකුලව විගණකාධිපති,අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ සියලුම මුල්‍ය වාර්තා හා සම්බන්ධිත දත්ත සමග මුල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඇති මතය මෙම වාර්තාවේ පිටු අංක 44-54 හි සඳහන්ව ඇත

# මූල්‍ය ප්‍රකාශන




2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

# ආදායම් ප්‍රකාශය

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|---|
| ආදායම | 1 | 7,647,780,487 | 5,646,878,417 |
| විකුණුම් පිරිවැය | 2 | (6,280,757,124) | (4,743,125,752) |
| **දළ ලාභය** | | 1,367,023,363 | 903,752,665 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 3 | 6,979,050 | 8,064,034 |
| පරිපාලන වියදම් | 4 | (247,137,830) | (237,694,200) |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | 5 | (49,137,643) | (99,189,983) |
| අනිකුත් මෙහෙයුම් වියදම් | 6 | (10,706,666) | (10,521,475) |
| **මෙහෙයුම් ලාභය** | | 1,067,020,274 | 564,411,041 |
| මූල්‍ය පිරිවැය | 7 | (509,716) | (447,124) |
| මූල්‍ය ආදායම | 8 | 94,487,181 | 28,093,141 |
| **බදු පෙර ලාභය** | | 1,160,997,739 | 592,057,058 |
| බදු වියදම | 9 | (143,633,422) | (157,279,180) |
| **වර්ෂය සඳහා ලාභය** | | 1,017,364,317 | 434,777,878 |

| විස්තීරණ ආදායම් ප්‍රකාශය | සටහන | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය | | 1,017,364,317 | 434,777,878 |
| (-) ප්‍රත්‍යක්ෂ (ලාභ)/අලාභ | | (22,227,485) | (2,182,882) |
| උපකල්පන වෙනස්වීම් නිසා වූ (ලාභ)/ අලාභ | | - | - |
| වෙනත් විස්තීරණ ආදයම් මත බදු | 9 (බී) | 4,000,947 | - |
| **බදු ගැලපීමෙන් පසු වෙනත් විස්තීරණ ආදයම** | | (18,226,538) | (2,182,882) |
| **බදු ගැලපීමෙන් පසු මුළු වෙනත් විස්තීරණ ආදායම** | | 999,137,780 | 432,594,996 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020.12.31 දිනට
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 10 | 3,117,911,777 | 3,203,159,799 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 2,570,308 | 3,440,402 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 14 | 2,147,321 | 2,754,426 |
| පෙර ගෙවූ කල් බදු | 13 | 3,233,254 | 3,282,243 |
| නොනිමි වැඩ - ඉදිකිරීම් | | 81,864,132 | 150,738,389 |
| යන්ත්‍ර | | 13,970 | 13,970 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 15 | 1,338,464,075 | 1,042,287,690 |
| වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ | 16 | 230,633,684 | 2,283,110,605 |
| පූර්ව ගෙවීම් | 17 | 12,001,846 | 21,165,516 |
| වෙනත් මූල්‍ය වත්කම් | 18 | 3,040,316,966 | 474,984,506 |
| බැංකු සහ අතැති මුදල් | 19 | 554,452 | 449,269 |
| | | 4,621,971,023 | 3,821,997,586 |
| **මුළු වත්කම්** | | 7,829,711,784 | 7,185,386,815 |
| **කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 850,000,000 | 850,000,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 20 | 690,079,000 | 690,079,000 |
| **රඳවා ගත් ඉපැයීම්** | | 3,686,214,826 | 2,761,709,649 |
| මුළු කාරක ප්‍රාග්ධනය | | 4,376,293,826 | 3,451,788,649 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැරකම් | | 106,799,809 | 75,028,761 |
| විලම්බිත බදු බැරකම් | 21 | 167,206,928 | 193,926,433 |
| JICA ණය | 22 | 2,416,094,044 | 2,416,094,043 |
| | | 2,690,100,781 | 2,685,049,237 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ | 23 | 677,033,320 | 964,712,097 |
| **ගෙවිය යුතු බදු** | | 86,283,856 | 83,836,831 |
| | | 763,317,177 | 1,048,548,928 |
| **මුළු කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | 7,829,711,784 | 7,185,386,815 |

මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 24 සිට 32 දක්වා ඇත. එසේම මෙම මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යොමුකර ඇති සේම රජයේ විගණන දෙපාර්තමේන්තුවට ද ඉදිරිපත් කර ඇත.

සභාපති ............................................ කළමණාකාර අධ්‍යක්ෂ ................................................

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - මූල්‍යඃ .................................... දිනය 28-02-2021

# ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ලාභය / (අලාභය) | එකතුව |
|---|---|---|---|
| 2019.01.01 දිනට ශේෂය | 690,079,000 | 2,265,198,267 | 2,955,277,267 |
| වර්ෂය සඳහා ලාභය | - | 434,777,878 | 434,777,878 |
| වෙනත් විස්තීරණ ආදයම් | - | (2,182,882) | (2,182,882) |
| මුළු විස්තීරණ ආදායම් | - | 432,594,996 | 432,594,996 |
| මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | - | - | - |
| පෙර වර්ෂයේ ගැලපුම් | - | 63,916,387 | 63,916,386 |
| **2019.12.31 දිනට ශේෂය** | 690,079,000 | 2,761,709,650 | 3,451,788,649 |
| | | | |
| 2020.01.01 දිනට ශේෂය | 690,079,000 | 2,761,709,650 | 3,451,788,650 |
| වර්ෂය සඳහා ලාභය | - | 1,017,364,317 | 1,017,364,317 |
| වෙනත් විස්තීරණ ආදයම් | - | (18,226,538) | (18,226,538) |
| මුළු විස්තීරණ ආදායම් | - | 999,137,780 | 999,137,780 |
| මහා භාණ්ඩාගාරය වෙත බදු | - | (24,632,603) | (24,632,603) |
| පෙර වර්ෂයේ ගැලපුම් | - | (50,000,000) | (50,000,000) |
| **2020.12.31 දිනට ශේෂය** | 690,079,000 | 3,686,214,826 | 4,376,293,826 |

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| බදු සහ අති විශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ලාභය / (අලාභය) | 1,160,997,739 | 592,057,058 |
| ගැලපුම් :- | | |
| ස්ථාවර වත්කම් මත ක්ෂය | 189,400,649 | 184,365,949 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 6,415,695 | 4,343,655 |
| සේවක පොළී පිරිවැය | 8,065,592 | 8,467,681 |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ/අලාභ | (107,745) | (28,424) |
| හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය | 3,122,097 | 59,400 |
| අය කර නොගත් ප්‍රමාද ගාස්තු | - | (55,384) |
| අය කර නොගත් රඳවා ගැනීම් | - | (962,908) |
| පොළී ආදායම | (87,837,692) | (22,678,826) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **1,280,056,334** | **765,568,201** |
| **කාරක ප්‍රාග්ධන අයිතමයන්හි වෙනස් වීම්** | | |
| තොග අඩු /(වැඩි) වීම | (296,176,385) | (199,969,965) |
| ණයගැතියන්ගේ හා අයවිය යුතුදේහි අඩු / (වැඩි) වීම | 1,962,180,490 | (619,338,522) |
| තැන්පතු වල සහ පෙර ගෙවීම්වල අඩු වීම/ (වැඩි) වීම | 9,163,670 | (3,792,198) |
| බැරකම් වල (අඩු) /වැඩි වීම | (287,678,778) | 372,893,619 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්** | **2,667,545,332** | **315,361,135** |
| පාරිතෝෂික ගෙවීම් | (4,937,725) | (7,706,911) |
| ආදායම් බදු ගෙවීම් | (123,608,519) | (77,020,297) |
| **මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල** | **2,538,999,088** | **230,633,927** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| කෙටිකාලීන ආයෝජන (සටහන - අ) | (2,553,811,909) | (105,802,239) |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | (37,500,997) | (147,617,267) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදයම | 127,358 | 28,424 |
| ලැබුණු පොළිය | 76,317,141 | 23,257,971 |
| වෙනත් ජංගම නොවන වත්කම් වල වැඩි වීම | 607,106 | (530,856) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල** | **(2,514,261,300)** | **(230,663,967)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මහා භාණ්ඩාගාරය වෙත බදු | (24,632,603) | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල** | **(24,632,603)** | **-** |
| **මුදල් සහ ආසන්න මුදල්වල ශුද්ධ වැඩි/ (අඩු) වීම.** | 105,184 | (30,040) |
| **වර්ෂය ආරම්භක මුදල් සහ ආසන්න මුදල්** | 449,268 | 479,308 |
| **වර්ෂය අවසාන මුදල් හා ආසන්න මුදල් (සටහන ආ)** | **554,452** | **449,268** |
| **සටහන (අ) - ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| වර්ෂය තුළ මුදල් ගලා ඒම් | 42,354,011,747 | 15,651,671,911 |
| වර්ෂය තුළ මුදල් ගලා යෑම් | (44,907,823,656) | (15,545,869,672) |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය** | (2,553,811,909) | 105,802,239 |
| **සටහන (ආ)** | | |
| **මුදල් සහ ආසන්න මුදල්** | | |
| ලංකා බැංකුව - රත්මලාන ශාඛාව | 53,584 | 6,910 |
| ලංකා බැංකුව - ආයතනික ශාඛාව | 192,301 | 327,273 |
| මහජන බැංකුව - රත්මලාන ශාඛාව | 136,590 | 36,590 |
| මහජන බැංකුව - ආයතනික ශාඛාව | 111,546 | 48,698 |
| මුදල් ශේෂය | 43,020 | 19,787 |
| සුළු මුදල් ශේෂය | 17,410 | 10,010 |
| | **554,452** | **449,268** |

# ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

**පොදු තොරතුරු**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත කර ඇත. මෙය රත්මලාන ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවතේ අංක 11 දරණ ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි.

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ වලට 2021 පෙබරවාරි 24 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

**ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ:**

(අ) තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ නැවත ඇසුරුම් කිරීම

(ආ) පාලිත සමාගම් නිර්මාණය කිරීම

(ඇ) අනාගත ආයෝජකයන් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට ඇතුළත් වීම

(ඈ) ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහය ලබා දීම

(ඉ) ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම සහ

(ඊ) සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මඟින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මඟින් නිපදවන ලද ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) වලට අනුකූලවය.

### 2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල වී ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය. සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ වල අගයන් ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන මත ඔවුන්ගේ වගකීම පිළිගෙන ඇත.

### 2.3 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල වී ඇත.

## 3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 3.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

මතු සඳහන් කරුණ හැර පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේදී භාවිතා කල ප්‍රතිපත්ති වලට අනුකූල වේ.

ජංගම නොවන වත්කම් යටතේ වර්ග කර ඇති මුලුමුනින්ම ක්ෂය කරන ලද පුස්තකාල පොත් ගිණුම් වලින් ඉවත් කර ඇත. නමුත් වර්ෂ අවසාන වත්කම් සත්‍යාපනයේදී එම පොත් තහවුරු කරගෙන ඇත.

#### 3.1.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ වීම් ඇත්නම් ඒවා ද අන්තර්ග්‍රහණය කොට ගණනය කළ ශුද්ධ පිරිවැය ලෙසය. එම පිරිවැයට දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවලට අළුතින් කොටස් මාරු කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණයට ගැනීමේ පිරිවැය ද ඇතුළත් වේ. යම් නියමිත කාලයකට වරක් දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, එම ඉවත් කරනු ලබන කොටසට අදළ පිරිවැය මුළු

පිරිවැයෙන් ඉවත්කරන අතර නව කොටසෙහි පිරිවැය ඇතුළත් කරන අතර ක්ෂය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මත ගණනය කරනු ලබයි. එලෙසම, ප්‍රධාන පෙළේ පිරික්සීමක් සිදු කරනු ලබන අවස්ථාවේදී එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරා

ලන්නේ නම්, දේපළ හා පිරියතෙහි ලියාපදිංචි අගයට ඇතුළත් කරනු ලබයි. දේපළ හා පිරියතෙහි අනිකුත් අලුත්වැඩියා කිරීම් හා නඩත්තු වියදම්, ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 3.1.2 ක්ෂය

ක්ෂය කිරීම් LKAS 16 මත පදනම්ව සිදු කරන අතර ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය කිරීම් එම වත්කම් භාවිතය ආරම්භ වූ දිනයේ සිට SLFRS 05 ට අනුව එම වත්කම විකිණීමට තීරණය කළ දිනය දක්වා සරල මාර්ග ක්‍රම පදනම අනුව, ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| බදු ඉඩම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| භූමි අලංකරණ වියදම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| ගොඩනැගිලි | අවුරුදු 4 සිට 40 දක්වා |
| වාහන නවතන ගොඩනැගිල්ල | අවුරුදු 4 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | අවුරුදු 1 සිට 25 දක්වා |
| මෝටර් වාහන | අවුරුදු 3 සිට 15 දක්වා |
| යතුරු පැදි | අවුරුදු 4 සිට 15 දක්වා |
| පා පැදි හා කරත්ත | අවුරුදු 8 |
| උපකරණ | අවුරුදු 2 සිට 30 දක්වා |
| පරිගණක උපාංග | අවුරුදු 1 සිට 10 දක්වා |
| පරිගණක මෘදුකාංග | අවුරුදු 1 සිට 6 දක්වා |
| ලී බඩු හා සවිකිරීම් | අවුරුදු 3 සිට 30 දක්වා |
| මෙවලම් | අවුරුදු 1 සිට 15 දක්වා |
| පුස්තකාල ග්‍රන්ථ | අවුරුදු 5 |

### 3.1.3 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත අපවය අඩු කරමිනි. ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය අගයන් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු නොලබන අතර වියදම ඇති වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුළ අදාළ වියදම පිළිබිඹු කෙරේ.

### 3.1.4 දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල හානිකරණය

දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල ධාරණ වටිනාකමේ හානිකරණය සමාලෝචනය කරනු ලබන්නේ වාර්ෂිකව හෝ වෙනස්කම් සිදුවීම් මගින් හෝ දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍රවල ධාරණ වටිනාකම අය කර ගත නොහැකි වීමට ඉඩ ඇති බව හඳුනා ගත් අවස්ථාවකදීය. එබඳු තත්ත්වයක් පවතින්නේ නම් සහ ධාරණ වටිනාකම ඇස්තමේන්තුගත අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්, වත්කම් ඒවායේ අය කර ගත හැකි වටිනාකමට සටහන් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි ප්‍රත්‍යාගණන අතිරික්තයන් සටහන් කිරීමට ප්‍රතිවිරුද්ධ සටහනක් ලෙස වත්කම් හානිකරණ අලාභ සටහන් කරනු ලැබේ.

### 3.1.5 මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

වත්කමක් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේදී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවතී නම්, එසේත් නැති නම් වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව අදාළ වත්කමේ අය කර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. වත්කමක අය කර ගත හැකි ප්‍රමාණය වනාහි වත්කමේ හෝ මුදල්-උත්පාදන ඒකකයේ (CGU) සාධාරණ වටිනාකමෙන්, විකිණීමේ වියදම් අඩු කිරීමෙන් ලැබෙන අගය හා භාවිතයේදී එහි වටිනාකම අඩු කළ විට ලැබෙන අගය යන අගයන් දෙකෙන් වඩා විශාල අගයයි. එය තනි වත්කම් සඳහා නිර්ණය කරනු ලබන්නේ වෙනත් වත්කම් වලින් හෝ වත්කම් සමූහ වලින් ආයතනය තුලට එන මුදල් ප්‍රවාහ වලින් ස්වායත්තව අදාළ තනි වත්කම ආයතනය

තුලට මුදල් උත්පාදනය කරන්නේ නම් පමණි. වත්කමක හෝ මුදල්-උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන විට, වත්කම හානිකරණය වී ඇතැයි සැලකෙන අතර, එය එහි අය කර ගත හැකි ප්‍රමාණය ලෙස සටහන් කරනු ලැබේ. භාවිතයේදී වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලේ වර්තමාන අගය සහ වත්කමට ආවේණික අවදානම්

පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු අගයන් පිළිබිඹු කරන බදු-පූර්ව වට්ටම් අනුපාතිකය භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වත්මන් වටිනාකමට වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් විකිණීමේ පිරිවැය අඩු කොට අගය නිර්ණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු (තිබේ නම්) සැලකිල්ලට ගනු ලැබේ. එබඳු ගනුදෙනු හඳුනා

ගත නොහැකි නම්, උචිත තක්සේරු ක්‍රමයක් භාවිතා කරනු ලැබේ.

### 3.1.6 බදුකරණය

### 3.1.6.1 වර්තමාන බදුකරණය

වර්තමාන සහ පෙර වර්ෂවල දී මෙන් බදු ආයතන වලට,ආයතනයේ බදු වත්කම් සහ බැරකම් මත බදු ගෙවීමක් සිදු කරයි. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂ පත්‍ර දින වන විට පනවා තිබූ ඒවා වේ.

ඒ අනුව, 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධන හා විධිවිධාන වලට අනුකූලව පනතේ නියම කර ඇති අනුපාතිකයන්ට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගනිමින් බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

### 3.1.6.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇති වත්කම් සහ වගකීම් වලට අදාල තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු බැරකම් හා වත්කම් සඳහා ප්‍රතිපාදන කර ඇත. අපගේ මූල්‍ය ප්‍රකාශයන් තුළ ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් වල ලියාහල පොත් අගය හා ලියාහල බදු වටිනාකම සඳහා විලම්බිත බදු බැරකමක්ද, විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් වූ ප්‍රතිපාදනය සඳහා විලම්බිත බදු වත්කමක්ද හඳුනා ගත්තෙමු. විලම්බිත බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් බදු අනුපාත අනුවය.

### 3.2. භාණ්ඩ තොග

'ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කල' පදනමින් අගය තක්සේරු කෙරෙන අභාවිත හෝ මන්දගාමී චලනයක් සහිත භාණ්ඩ සඳහා නිසි වෙන් කිරීම් කළ පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග අගය කරනු ලැබේ.

### 3.2.1 තොග අගය කිරීම තොග පිරිවැය

**අමුද්‍රව්‍ය**

කවර හෝ පසු වියදම්ද ඇතුළුව මිලට ගැනිමේ පිරිවැය

**නොනිමි වැඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**නිමි භාණ්ඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**වෙනත් තොග**

පිරිවැය නිශ්චය කර ඇත්තේ බර තැබූ සාමාන්‍යය පදනමිනි.

### 3.2.2 වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ

වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත හඳුනා ගෙන පසු වර්ෂයන්හිදී හානිකරණය සඳහා ප්‍රතිපාදන වලට යටත්ව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. 2020.12.31 දිනට දීර්ඝ කාලයක් හිඟ හිටි මුදලක් නොතිබු බැවින් මෙම සංස්ථාව වෙළඳ ණයගැතියන් සඳහා කිසිදු හානිකරණයට අදාල ප්‍රතිපාදනයක් කොට නැත.

### 3.2.3 මුදල් හා මුදල්වලට සමාන දේ

මුදල් හා මුදල්වලට සමාන දේ යන්නට අත ඇති මුදල්, බැංකු ශේෂය හා කෙටි කාලීන ආයෝජන ඇතුළත්ය.

### 3.2.4 සබැඳි පාර්ශවයන් සමග ගනුදෙනු

**කළමණාකරන පාර්ශවයන් සමඟ ඇති ගනු දෙනු**

සංස්ථාවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති පුද්ගලයින් ප්‍රධාන කළමණාකරන

නිලධාරීන් ගණයට වැටේ. එම හඳුන්වා දීම අනුව සංස්ථාවේ විධායක හා විධායක නොවන ගණයට අයත් අධ්‍යක්ෂකවරුන් ප්‍රධාන කළමණාකරන නිලධාරීන් ලෙස වර්ගීකරණය කළ හැක. ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ට( අධ්‍යක්ෂක මණ්ඩලයට) ගෙවන ලද දීමනා පහත පරිදි වේ.

| | 2020 | 2019 |
|---|---:|---:|
| කෙටිකාලීන ප්‍රතිලාභ | 3,385,180 | 2,322,175 |
| තෑගි වවුචර | 200,000 | 34,000 |

**රාජ්‍ය හා රාජ්‍ය පාලනය සහිත ආයතන සමග ගනුදෙනු**

සංස්ථාව සිය සාමාන්‍ය මෙහෙයුම් වලදී සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු වලට එළඹෙයි. සබැඳි පාර්ශවයන්ට ශ්‍රී ලංකා රජය (රාජ්‍යඃ සංස්ථාවේ හිමිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන ඇතුළත්ය. රජය සහ රජය විසින් පාලනය කරනු ලබන හා තනි තනිව වැදගත් වන්නාවූ හෝ අන් සමහර ගනුදෙනු සම්බන්ධයෙන් තනි තනිව නොව, සාමූහිකව වැදගත් වන්නා වූ ආයතන සමග සංස්ථාව එළඹුනු ගනුදෙනු හා විධිවිධාන පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

**ගනුදෙනුවේ ස්වභාවය**

| ගනුදෙනු | 2020 | 2019 |
|---|---:|---:|
| සංස්ථාව සතු ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වල ආයෝජන | 3,040,316,968 | 474,984,506 |
| වර්ෂය තුළ රජය වෙත කල ගෙවීම් | 24,632,603 | - |
| විකුණුම් හිඟ හිටි ශේෂය | 7,647,688,798 | 5,646,878,417 |
| | | |
| **හිඟ ශේෂය** | | |
| රා. ඖ. සං. වෙතින් අය විය යුතු දේ | 23,287,160 | 38,929,551 |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙතින් අය විය යුතු දේ | 42,220,340 | 2,003,016,236 |

### 3.2.5 ප්‍රාග්ධනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අනුදත් ප්‍රාග්ධනයෙහි වෙනසක් වී නොමැත.

### 3.2.6 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදු වූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය අවස්ථාවන්හිදී යෝග්‍ය වෙනස්කම් සිදු කර ඇති අතර, අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශයට අනාවරණයන් සිදු කර ඇත.

### 3.2.7 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණින් සිදු කරන ලද පර්යේෂණ කටයුතු සඳහා වියදම් ඇති වූ අවස්ථාවේදී ඒවා ලාභාලාභ ගිණුම තුළ පෙන්වා ඇත.

## 4. බැරකම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1 නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සේවකයකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකම පැන නගින්නේ සේවකයකු සංස්ථාව සමග අවුරුදු 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදීය. මෙම වගකීම සපුරාලනු පිණිස මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂය මුලදී ඉදිරියට ගෙනා ප්‍රතිපාදනය සහ වර්ෂය අවසානයේදී ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර ඇති වන වෙනස ආදායම් ප්‍රකාශය තුළ දක්වා ඇත.

LKAS 19 – (සේවක ප්‍රතිලාභ) විසින් නිර්දේශ කරනු ලබන පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වාර්තා කරන දිනට සුදුසුකම් ලත් පණතක් මගින් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලැබේ.

ගණනය කිරීම්වලදී භාවිතා කෙරෙන ප්‍රධාන උපකල්පනයන් පහත සඳහන් පරිදි වේ.

| | 2020 | 2019 |
|---|---|---|
| අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය | 4.00% | 4.00% |
| වට්ටම්/පොලී අනුපාතිකය | 9.00% | 10.75% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | 1.4% | 1.00% |

මෙම බැරකම සම්බන්ධයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුල භාණ්ඩාගාර බිල්පත් වල මුදල් ආයෝජනය කර ඇත.මෙය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම නොවන බැරකම් යටතේ කාණ්ඩගත කෙරේ.

### 4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ඇති සියලුම සේවකයන් අදාල රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මගින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් පිළිබඳ වගකීම් භාරයන් ආදායම් ප්‍රකාශය තුළ වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

සංස්ථාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර සංස්ථාව විසින් සේවක ඒකාබද්ධ වැටුපෙන් 15% ක් අරමුදලට දායක වේ.

සේවක භාරකාර අරමුදල

සංස්ථාව සේවකයන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායක වේ.

### 4.1.3 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ ඒවායේ පිරිවැය අනුව සඳහන් කර ඇත. වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත අගය කර පසුව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට හානිකරණ සඳහා ප්‍රතිපාදනයන් අඩුකරයි. 2020.12.31 දිනට සැලකිය යුතු අවදානමක් නොමැති බැවින් පසු වර්ෂයන් හිදී ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත පිරිවැයක් සඳහා සංස්ථාව කිසිදු ප්‍රතිපාදනයක් සිදු කොට නැත.

### 4.1.4 ප්‍රතිපාදන පොදු

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන (නෛතික හෝ අර්ථවිග්‍රහ කළ) වගකීම් භාරයක් සංස්ථාවට ඇති විට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. අදාළ වගකීම පියවනු පිණිස ආර්ථික ප්‍රතිලාභයක් ඇති වත්කම් වලින් මුදල් ප්‍රවාහයක් ගලා යන්නේ නම් සහ වගකීම් භාරයේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වීමේ හැකියාව තිබිය හැකිය. සංස්ථාව ප්‍රතිපාදනයෙන් කොටසක් හෝ සමස්තයම ප්‍රතිපූරණය කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන තැන්හිදී (නිදසුනක් ලෙස රක්ෂණ ගිවිසුමක් යටතේ) වුවද ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගනු ලබන්නේ ප්‍රතිපූරණය නිශ්චිතවම හඳුනාගත් විටය. කවර හෝ ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් වූ වියදමක් ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ ඊට අදාල ප්‍රතිපූරණයන් අඩු කොටය.

මුදලේ වර්තමාන අගයේ වෙනස්වීම වැදගත් නම්, උචිත තැන්හිදී බැරකමට වන විශේෂිත අවදානම් සඳහා පිළිඹිබු කරන වත්මන් බදු-පූර්ව අනුපාතිකයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කෙරේ. වට්ටම්කරණය භාවිතා කරන තැන්හිදී කාලය ගත වීමත් සමගම ප්‍රතිපාදනයේ ඇති වන වෙනස මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ශ්‍රීත ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමගින් සංස්ථාවේ කාර්යසාධනයෙහි සංරචකයන් සාධාරණව නිරූපනය වන නිසාය.

### 5.1.1 පිරිවැටුම

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බෙද හරින්නන් වෙත කෙරෙන අලෙවියෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පිරිවැටුම සමන්විත වේ.

### 5.1.2 ආදායම් හඳුනා ගැනීම

ගෙව න අවස්ථාව කවරක් වුවද, ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව ඇති හා ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය විශ්වාසය තැබිය හැකි අයුරින් මැනිය හැකි මට්ටමට ආදායම හඳුනා ගනු ලැබේ. ගිවිසුම්ගතව නිර්වචනය කරන

ලද ගෙවීමේ නියමයන් සැලකිල්ලට ගනිමින් හා බදු හෝ තීරු ගාස්තු බැහැර කරමින්, ලැබුණු හෝ අය විය යුතු ප්‍රතිෂ්ඨාවේ

සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සංස්ථාව සිය ආදායම් සැලසුම් වල විධිවිධානයන් දෙනු ලබන ප්‍රධානියා වේ. ආදායමක් වශයෙන් හඳුනාගැනීමේදී පහත සඳහන් විශේෂ පිළිගත් මිනුම් දඬු සපුරාලිය යුතුය.

### භාණ්ඩ අලෙවිය

ආයතනයේ විකුණුම් ආදායම සමන්විත වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය වෙත කරන ලද විකුණුම්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා අප වෙත ලියාපදිංචිව සිටින බෙදාහරින්නන්ට කරන විකුණුම් වලින් වේ

භාණ්ඩය විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගනු ලබන්නේ ආයතනයේ අවධානම සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත මාරු කළ පසුය.

සංස්ථාවේ ආදායම පහත සඳහන් ප්‍රභවයන්ගෙන් සැකසී ඇත.

(අ) වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ සැපයීම (රජයේ රෝහල්) : සංස්ථාව නිෂ්පාදනය කරන ඖෂධ සහ බද්ධ ව්‍යාපාර වලින් මිලදී ගන්නා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත විකිණීම සිදුකරයි. නිෂ්පාදන වෛද්‍ය සැපයුම් අංශයට මාරු කරන අවස්ථාවේ දී "විකුණුම්" ආදායමක් ලෙස හඳුනාගැනේ. SPMC බද්ධ ව්‍යාපාර නිෂ්පාදන වෛද්‍ය සැපයුම් අංශයට සපයනු ලබන්නේ මිලදී ගැණුම් මිලට 6%ක් එකතු කිරීමෙනි.

(ආ) බෙදා හරින්නන් හරහා ඖෂධ සැපයීම : සංස්ථාව 2003 සිට බෙදාහරින්නන් හරහා ඖෂධ අලෙවි කරයි.

සංස්ථාව පහත සඳහන් බද්ධ ව්‍යාපාර පිහිටුවා ඇත.

| ආයතනයේ නම | ලිපිනය | හිමිකාරීත්වයේ ප්‍රතිශතය | ප්‍රධාන ක්‍රියාකාරකම |
|---|---|---|---|
| සෙලොජන් ලංකා පුද්ගලික සමාගම | 116, ලයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14. | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |
| දියත ෆාමසියුටිකල් ඇන්ඩ් හෙල්ත්කෙයා පුද්ගලික සමාගම | 53/ඒ/1, බටගම උතුර, ජා ඇල. | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |

සංස්ථාව හා බද්ධ ව්‍යාපාර සමාගම, බද්ධ ව්‍යාපාරයේ ඉහත සඳහන් කොටස් හිමිකම සම්බන්ධයෙන් කොටස් හිමි ගිවිසුමක් ක්‍රියාත්මක කල යුතුය. මෙම හවුල් ව්‍යාපාර සමාගම් SPMC වෙත ප්‍රධානය කරන ලද මෙම කොටස් හිමිකාරීත්වයේ මෙම ප්‍රතිශතය, ගිවිසුමේ අපේක්ෂිත කාලය පුරාවටම පවත්වාගෙන යාමට වග බලා ගනී.

කොටස් හිමිකම පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| කොටස් හිමි ආයතනය | කොටස් ගණන | නිකුතු දිනය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| සෙලොජන් ලංකා පුද්ගලික සමාගම | 3,000,000 | 2020.10.21 | 3,000,000 |
| දියත ෆාමසියුටිකල් ඇන්ඩ් හෙල්ත්කෙයා පුද්ගලික සමාගම | 1,500,000 | 2020.10.21 | 1,500,000 |

### ආදායම වර්ගීකරණය

විකුණුම් වල ස්වභාවය අනුව ආදායම වර්ගීකරණය කර ඇත.

| | 2020 | 2019 |
|---|---|---|
| වෛද්‍ය සැපයුම් අංශය - SPMC නිෂ්පාදන | 3,125,364,543 | 2,322,044,481 |
| බද්ධ ව්‍යාපාර නිෂ්පාදන | 3,513,839,561 | 2,370,063,720 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | 6,602,500 | 5,885,075 |
| බෙදාහරින්නන් | 1,001,882,193 | 948,206,015 |

### 5.1.3 වියදම්

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියලුම වියදම් ආදායමෙන් අඩු කර ඇත. අළුත්වැඩියාවන් හා අළුත් කිරීම් එම වියදම ඇති වූ වර්ෂයේ ලාභ අලාභවලට අය කරනු ලැබේ.

### 5.1.4 මූල්‍ය වියදම්

මූල්‍ය වියදම් සමන්විත වන්නේ බැංකු අයිරා මත පොළිය, ණයවර ලිපි විවෘත කිරීමේ වියදම්, සහ ණය පහසුකම් ගිවිසුම් ගාස්තු යන මේවායින්ය.

### 5.1.5 පොදුකාර්ය වියදම් ප්‍රතිපාදනය

මූල්‍ය ප්‍රකාශ තුළ පොදුකාර්ය ප්‍රතිපාදන ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

**වියදම්**

(අ) වරිපනම් බදු, විදුලිය, ජල ගාස්තු, රක්ෂණ, උපකරණ නඩත්තු, පොදු නඩත්තු, ගොඩනැගිලි නඩත්තු, ක්ෂය

(ආ) සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරිකය, කාර්ය මණ්ඩල සුභසාධනය, නිල ඇඳුම් හා පාවහන්, සහ ප්‍රවාහන ගාස්තු

(ඇ) අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු, වෙනත් දිරිදීමනා, මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු, වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය, තැපැල් හා ෆැක්ස් ගාස්තු, දුරකථන ගාස්තු, ආරක්ෂක ගාස්තු, වාහන හා ඖෂධ බලපත්‍ර ගාස්තු, මුද්‍රණ කටයුතු හා ලිපිද්‍රව්‍ය, කාර්යාල වියදම්, විගණන ගාස්තු, කුළී ගාස්තු, ප්‍රචාරක දැන්වීම්, වෙළඳ දායකත්වයන් හා වාර සඟරා, නීති හා පරීක්ෂණ වියදම්, වෘත්තීයවේදී ගාස්තු, සංග්‍රහ, වාර්ෂික දායකත්වයන්, වාර්ෂික සමුළු හා රැස්වීම්, මුද්දර ගාස්තු, ලිපිද්‍රව්‍ය තොග සත්‍යාපන ගැලපුම්.

(ඈ) කාර්ය මණ්ඩල ප්‍රතිලාභ සහ වෙනත් වියදම්

**ප්‍රතිපාදන ක්‍රමය**

අ) අදාල පිරිවැය සෘජුවම නිෂ්පාදන හෝ පරිපාලන වියදම් ලෙස හඳුනා ගනු ලබන අවස්ථා වලදී ඒ ඒ පිරිවැය යටතේද පොදු පිරිවැයක් වන්නේ නම් එයද 70% හා 30% වශයෙන් පිලිවෙලින් නිෂ්පාදන හා පරිපාලන වශයෙන් වෙන් කරනු ලැබේ.

(ආ) එක් එක් අංශයේ සිටින සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන පිරිවැය බෙදනු ලැබේ.

(ඇ) තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

(ඈ) තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

## 6. මූල්‍යකරණ මෙවලම් - ප්‍රථම සහ පසු වර්ෂ සඳහා තක්සේරු කිරීම

### 6.1 මූල්‍ය වත්කම

### 6.1.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

ශ්‍රී.ල.මු.වා.ප්‍ර අංක 39 හි විෂයපථය තුළ මූල්‍ය වත්කම් වර්ගීකරණය වී ඇත්තේ ලාභ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම්, ණය හා අය විය යුතු දේ, කල් පිරීම දක්වා කරනු ලබන ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙසයි. ඒ අනුව වටිනාකම ආයතන වලට යෝග්‍ය ආකාරයට තම මූල්‍ය වත්කම් වර්ගීකරණය නිර්ණය කළ යුතුය.

සියලුම මූල්‍ය වත්කම් වෙළඳපල වටිනාකමට අගය කලයුතු අතර වෙළඳපල අගය තීරණය කල නොහැකි අවස්ථා වල එම මූල්‍ය වත්කම් ගනුදෙනු අගය කල පිරිවැයට අගය කල යුතුය.

සංස්ථාවේ මූල්‍ය වත්කම් වලට මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ, කාර්ය මණ්ඩල ණය, සහ වෙනත් අය විය යුතු දේ ඇතුළත් වේ.

### 6.1.2 පසු තක්සේරුව

මූල්‍ය වත්කම් වල පසු වර්ෂ වල තක්සේරුව පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

### 6.1.3 ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම්

ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වනුයේ විකිණීම සඳහා වෙන් කරන ලද මූල්‍ය වත්කම් හා මුල් හඳුනාගැනීමේදී මෙම වර්ගීකරණයට අයත් යැයි නිර්ණය කරන ලද මූල්‍ය වත්කම්ය. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීමේ හෝ යළි මිලට ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇති නම් ඒවා විකිණීම සඳහා වෙන්කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

### 6.1.4 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ අය විය යුතු දේ වනාහි ක්‍රියාශීලී වෙළඳපලක තක්සේරු නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකුණා ඉපයීමක් නොකරන මූල්‍ය වත්කම්ය. මුල් හඳුනා ගැනීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු වර්ෂයන් හි තක්සේරු කරනු ලබන්නේ හානිවීම අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන

ලද පිරිවැයටය. ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කල සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදයම

තුළ සඵලපොලී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් නිසා පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ.

### 6.1.5 කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්ප වෙළඳපලේ විකිණීමක් නොකරන සංස්ථාවට කල්පිරීම දක්වා දැරීමේ හැකියාව හා සාධනීය චේතනාව තිබේ නම් ඒවා කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කල් පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන තක්සේරු කරනු ලබන්නේ හානිවීම් අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය.ගාසතු හා පිරිවැය සහ අත්කර ගැනීමේදි වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබන පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුළ සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුලින් පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන නොතිබුණි.

### 6.1.6 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට කාරක ප්‍රාග්ධනය හා ණය සුරැකුම් ඇතුළත්ය. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇත්තේ කාරක ප්‍රාග්ධන ආයෝජන විකිණීම සඳහා රඳවා ගනු ලබන ලෙස වර්ගීකරණය කරනු ලැබූ ලාභ හෝ අලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය කර නොමැති ඒවාය. මෙම ප්‍රභේදය තුල ඇති ණය සුරැකුම් වනාහි ද්‍රවශීලතාව සඳහා වූ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් අලෙවි කරනු ලැබිය හැකි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා රඳවනු ලැබීමට අපේක්ෂා කෙරෙන ඒවාය.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන මූලික හඳුනාගැනීමෙන් පසුව, සමුච්චිත අලාභය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ යළි වර්ගීකරණය කොට විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරෙන අතර, සමුච්චිත අලාභය වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගන්නා හෝ හානි වූ ලෙස නිර්ණය කරනු ලබන අවස්ථාවක, ආයෝජන ලෙස හඳුනා නොගැනීමක් කෙරෙන තෙක්, විකිණීමට ඇති සංචිතය තුළ අනෙකුත් අංග සම්පූර්ණ ආදායම ලෙස හඳුනා ගනු ලැබූ අනු උපලබ්ධි ලාභ හෝ අලාභ සමග වෙළඳපල වටිනාකමට තක්සේරු කරනු ලැබේ.විකිණීමට ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

සංස්ථාව සිය විකිණීමට ඇති මූල්‍ය වත්කම් තක්සේරු කරනුයේ නුදුරු කාලයේදී මෙම මූල්‍ය වත්කම් විකිණීමට ඇති හැකියාව හා අභිප්‍රාය තවමත් උචිතද යන්න නිශ්චය කරනු පිණිසය. වෙළඳපලේ අක්‍රීය බව නිසා මෙම මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීමට සංස්ථාවට නොහැකි වන විට සහ එසේ කිරීමට කළමනාකාරිත්වයට ඇති අභිප්‍රාය සාදෘශ්‍ය අනාගතයේදී සැලකිය යුතු ලෙස වෙනස් වන විට, සංස්ථාව ඉතා කලාතුරකින් මෙම මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කිරීමට තීරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දේවල නිර්වචනය සපුරාලයි නම් සහ සාදෘශ්‍ය අනාගතය තුළ හෝ කල්පිරෙන තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට ඇති හැකියාව හා අභිප්‍රාය බැංකුවට ඇති විට ඒවා ණය හා අයවිය යුතු දේ ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබේ. කල්පිරෙන තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබෙනුයේ ආයතනයට අදාළ මූල්‍ය වත්කම එලෙස රැඳවීමට හැකියාව හා අභිප්‍රාය තිබේ නම් පමණි.

'විකිණීමට ඇති' ප්‍රභේදයෙන් ඉවත්ව යළි වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන්, කාරක ප්‍රාග්ධනය තුළ හඳුනා

ගෙන ඇති එම වත්කමේ කවර හෝ පෙර ලාභයක් හෝ අලාභයක් සඵල පොළී අනුපාතික භාවිතා කරමින් ආයෝජනයේ ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර ඇති වන කවර හෝ වෙනසක් වුවද සඵල පොළී අනුපාතික භාවිතා කරමින් වත්කමෙහි ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ. අදාළ වත්කම් පසුව හානි වී ඇතැයි නිර්ණය කරනු ලබන්නේ නම්, එවිට කාරක ප්‍රාග්ධනය තුළ සටහන් කරන ලද ප්‍රමාණය ආදායම් ප්‍රකාශය වෙත යළි වර්ගීකරණය කරනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කිසිදු විකිණීමට ඇති මූල්‍ය ආයෝජන නොතිබුණි.

### 6.1.7 හඳුනා නොගැනීම්

මූල්‍ය වත්කමක් (එසේත් නැත හොත්, අදාළ අවස්ථාව අනුව, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගැනීමක් කරනු ලබන්නේ පහත අවස්ථාවන්හිදී.

i). වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය ඉකුත් වීම

ii). සංස්ථාව එම වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිවාසිකම් පවරා තිබීම හෝ 'විනිවිද යන' විධිවිධානයක් යටතේ තුන්වන පාර්ශවයකට බලවත් ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් පූර්ණ වශයෙන් ගෙවීමේ වගකීමක් භාර ගෙන තිබීම සහ

අ) සංස්ථාව වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පවරා තිබීම හෝ

ආ) සංස්ථාව, වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පැවරීමකින් හෝ රඳවා ගැනීමකින් තොරව වත්කමේ පාලනය පවරා තිබීම.

### 6.1.8 මූල්‍ය වත්කම් හානිකරණය

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි කිසිවක් තිබේදැයි සංස්ථාව එක් එක් වාර්තාකරණ දිනයේදී තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී ඇතැයි සලකනු

ලබන්නේ වත්කමේ මූලික හඳුනා ගැනීමට පසුව සිදු වූ සිදුවීමක හෝ කීපයක ප්‍රතිඵලය වශයෙන් හානි වීමක් පිළිබඳව පිළිගත හැකි සාක්ෂි ඇති නම් සහ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත විශ්වාසය තැබිය හැකි අයුරින් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් මගින් අලාභ ගෙන දෙන සිදුවීමක් හෝ සිදුවීම් ඇති නම් පමණි.

හානිකරණයේ සාක්ෂි ලෙස ණයගැතියන්ගේ හෝ ණයගැති සමූහයේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොළී හෝ මුල් මුදල් ගෙවීම් පැහැර හැරීම, බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍ය සංවිධානය වීම්වලට අවතීර්ණ වීම අත්විඳිමින් සිටින බව දක්වන සංඥා සහ පැහැර හැරීම්වලට සහසම්බන්ධ හිඟ වාරික හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩු වීමක් තිබෙන බව හඟවන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ.

### 6.1.9 ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව මුලින්ම, තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිවීමේ සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහික වශයෙන් හානිවීමේ වාස්තවික සාක්ෂි

තිබේද යන්න තක්සේරු කරයි. තනිව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කම් සඳහා හානිවීමේ වාස්තවික සාක්ෂි නොමැති බවට සංස්ථාව තක්සේරු කරන්නේ නම් එම වත්කම සැලකිය යුතු එකක් වුවද, නොවූවද, සංස්ථාව එම වත්කම එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුළත් කොට, හානිවීම සම්බන්ධයෙන් අදාළ වත්කම් කණ්ඩායමම සාමූහිකව තක්සේරු කරයි. හානිවීමක් ඇතිදැයි තනි තනිව තක්සේරු කරනු ලබන හා අපව අලාභයක් ඇති හෝ අඛණ්ඩව පවතිනු ඇති ලෙස හඳුනා ගනු ලබන වත්කම් සාමූහික අපව තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

හානිවීමේ අලාභයක් සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි පවතී නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (තවමත් ඇති වී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය අලාභයන් ඇතුළත් නොවන) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ය. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ. සංස්ථාව එක් එක් ණයගැති ප්‍රභේදය සඳහා විශේෂිත හානි වීම තක්සේරු කිරීම සිදු කර ඇත.

# 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන

01 සටහන

| ආදායම | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| විකුණුම් - රාජ්‍ය ඖෂධ සංස්ථාව | 6,602,500 | 5,885,075 |
| විකුණුම් - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 6,639,295,794 | 4,692,787,326 |
| විකුණුම් - බෙදාහරින්නන් | 1,001,882,193 | 948,206,016 |
| | 7,647,780,487 | 5,646,878,417 |

02 සටහන

| විකුණුම් පිරිවැය | | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|---|
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ සංස්ථාව | | 3,702,696 | 3,083,302 |
| විකුණුම් පිරිවැය - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | 5,424,055,808 | 3,775,578,421 |
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | | 660,141,081 | 664,527,236 |
| විකුණුම් පිරිවැය - ඉන්වොයිසි විචලනය | | (1,246,687) | 697,716 |
| තොග ගණන් ගැනීමේ ගැලපුම් - නිමි භාණ්ඩ | | 6,890.57 | - |
| නිෂ්පාදන වියදම් | සටහන -2 'අ' | 194,097,335 | 299,239,077 |
| | | 6,280,757,124 | 4,743,125,752 |

## 2 'අ' සටහන

| නිෂ්පාදන පිරිවැය | අවශෝෂණය නොකල පිරිවැය | විකුණුම් පිරිවැය සඳහා අවශෝෂණය කල පිරිවැය | එකතුව 2020 | එකතුව 2019 |
|---|---|---|---|---|
| **සෘජු ශ්‍රමය (නිෂ්පාදනය)** | | | | |
| වැටුප් හා වේතන | - | 49,463,511 | 49,463,511 | 45,100,875 |
| අනියම් සේවක වැටුප් | - | 3,172,887 | 3,172,887 | 1,853,067 |
| ජීවන වියදම් දීමනාව | - | 10,530,679 | 10,530,679 | 10,369,271 |
| ගමන් වියදම් දිරිදීමනා | - | 8,622,024 | 8,622,024 | 7,495,203 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 18% | - | 11,674,712 | 11,674,712 | 10,618,898 |
| අතිකාල | - | 20,585,319 | 20,585,319 | 14,626,231 |
| පැමිණීමේ දිරිදීමනාව | - | 8,915,333 | 8,915,333 | 6,456,794 |
| නිෂ්පාදන දිරිදීමනාව | 430,800 | 12,600,253 | 13,031,053 | 13,729,336 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 147,861 | 8,014,810 | 8,162,671 | 2,532,279 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 910,139 | 1,384,581 | 2,294,720 | 1,510,450 |
| සේවක පොළී පිරිවැය | 2,853,582 | - | 2,853,582 | 3,035,650 |
| සේවාමුර දිරිදීමනාව | - | 3,789,900 | 3,789,900 | 3,639,200 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | - | 3,296,415 | 3,296,415 | 4,625,394 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | - | 6,256,951 | 6,256,951 | 7,522,722 |
| වැඩ බැලීමේ දීමනා | - | 108,000 | 108,000 | 108,000 |
| දුෂ්කර සේවා දීමනාව | - | 3,134,940 | 3,134,940 | 3,281,790 |
| වෘත්තියවේදී ගාස්තු | - | 239,000 | 239,000 | 249,000 |
| විශ්‍රාමික ප්‍රතිලාභ | 108,000 | - | 108,000 | 256,000 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 2,032,224 | - | 2,032,224 | 1,568,983 |
| | 6,482,607 | 151,789,314 | 158,271,921 | 138,579,143 |
| **වක්‍ර නිෂ්පාදන පිරිවැය(තත්ව පාලන/ පර්යේෂණ/ සැලසුම් /නඩත්තු)** | | | | |
| වැටුප් හා වේතන | - | 37,014,953 | 37,014,953 | 32,499,444 |
| අනියම් සේවක වැටුප් | - | 801,247 | 801,247 | 1,630,593 |
| ජීවන වියදම් දීමනාව | 315,012 | 6,948,256 | 7,263,268 | 7,164,472 |
| ගමන් වියදම් දිරිදීමනා | 455,000 | 6,100,129 | 6,555,129 | 5,691,901 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 18% | - | 8,580,176 | 8,580,176 | 7,615,051 |
| අතිකාල | 807,423 | 13,708,569 | 14,515,991 | 9,874,155 |
| පැමිණීමේ දිරිදීමනාව | 836,942 | 6,786,147 | 7,623,088 | 5,294,531 |
| කාර්යසාධන දිරිදීමනාව | 1,049,300 | 9,501,891 | 10,551,191 | 11,383,746 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 720,005 | 5,405,930 | 6,125,935 | 1,726,496 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 880,671 | 991,965 | 1,872,636 | 1,238,368 |
| සේවක පොළී පිරිවැය | 2,444,150 | - | 2,444,150 | 2,269,478 |
| සේවාමුර දිරිදීමනාව | 134,600 | 2,187,900 | 2,322,500 | 1,341,200 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 145,488 | 2,186,801 | 2,332,289 | 2,804,905 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 282,605 | 3,555,677 | 3,838,281 | 5,479,287 |
| සුපරීක්ෂක දීමනා | - | 144,000 | 144,000 | 147,000 |
| දුෂ්කර සේවා දීමනාව | 240,420 | 1,334,595 | 1,575,015 | 1,630,185 |
| වෘත්තියවේදී ගාස්තු | 40,000 | 252,000 | 292,000 | 307,500 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 1,332,809 | - | 1,332,809 | 1,016,536 |
| විශේෂ වැඩ බැලීමේ දීමනාව | 167,358 | - | 167,358 | 167,358 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 11,431 | 348,109 | 359,540 | 371,052 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමයේ වාරිකය | 5,673 | 8,889,279 | 8,894,952 | 11,365,299 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 1,120,904 | 32,366,977 | 33,487,881 | 29,651,485 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 90,575 | 167,200 | 257,775 | 2,902,960 |
| නිල ඇඳුම් හා පාවහන් | 50,427 | 1,454,601 | 1,505,028 | 1,503,506 |
| ජල ගාස්තු | - | 2,438,660 | 2,438,660 | 2,308,272 |
| වරිපනම් හා බදු | - | 720,203 | 720,203 | 738,843 |
| විදුලිය | - | 32,639,456 | 32,639,456 | 30,519,874 |
| රක්ෂණය - පොදු | - | 2,669,597 | 2,669,597 | 1,560,543 |
| ආරක්ෂක ගාස්තු - නිෂ්පාදන | 2,886,549 | 3,386,578 | 6,273,127 | 7,449,685 |
| උපකරණ නඩත්තුව | - | 1,696,677 | 1,696,677 | 3,327,529 |
| නිෂ්පාදන නඩත්තු කටයුතු | 342,324 | 15,607,969 | 15,950,293 | 22,640,519 |
| ගොඩනැගිලි නඩත්තු කටයුතු | - | 262,040 | 262,040 | - |
| ක්ෂය | 163,925,406 | - | 163,925,406 | 160,667,919 |
| ප්‍රවාහන ගාස්තු | 90,890 | 443,201 | 534,091 | 1,667,242 |
| අමතර කොටස් පරිභෝජනය | - | 24,204,758 | 24,204,758 | 24,826,296 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය පරිභෝජනය | - | 15,426,985 | 15,426,985 | 16,896,788 |
| යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව | 53,768 | 5,133,787 | 5,187,555 | 6,215,434 |
| තත්ත්ව පාලන වියදම් | (3,500) | 10,002,876 | 9,999,376 | 727,816 |
| අමුද්‍රව්‍ය විනාශ කිරීමේ පිරිවැය | 1,431,739 | - | 1,431,739 | 651,722 |
| ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍යවල පිරිවැය | 5,200,417 | - | 5,200,417 | 181,733 |
| ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය | 1,170,221 | - | 1,170,221 | - |
| ප්‍රතික්ෂේපිත නොනිමි ද්‍රව්‍ය පිරිවැය | - | - | - | 599,820 |
| හානි වූ අමුද්‍රව්‍යවල පිරිවැය | (24,000) | - | (24,000) | (24,000) |
| අමුද්‍රව්‍ය ගැලපුම - සාමාන්‍ය ඖෂධ | 124,056 | - | 124,056 | (8,579) |
| අමුද්‍රව්‍ය ගැලපුම - පෙනිසිලින් ඖෂධ | 5,349 | - | 5,349 | (7,913) |
| අමුද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | (943,204) | - | (943,204) | (2,371,993) |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | (468,663) | - | (468,663) | 74,580 |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම | - | | - | 580,479 |
| තොග සත්‍යාපන ගැලපුම - නඩත්තු | (51,417) | - | (51,417) | 37,814 |
| අමතර කොටස් ගැලපුම | 2,869,504 | - | 2,869,504 | - |
| නොනිමි ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | (125,503) | - | (125,503) | 1,250,160 |
| | 194,097,335 | 415,148,502 | 609,245,838 | 564,166,234 |

## 03 සටහන

| වෙනත් මෙහෙයුම් ආදායම් | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---:|---:|
| විවිධ ආදායම් | 6,825,266 | 7,284,562 |
| අමුද්‍රව්‍ය හා නිමිභාණ්ඩ විකුණුම් | 46,040 | 751,048 |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ/අලාභ | 107,745 | 28,424 |
| | 6,979,050 | 8,064,034 |

## 03 අ සටහන

| විවිධ ආදායම් | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---:|---:|
| අබලි ද්‍රව්‍ය විකිණීම | 4,384,009 | 3,494,533 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 674,000 | 590,000 |
| ටෙන්ඩරපත් විකිණීම | 1,745,100 | 1,185,000 |
| ලියා හල බැඳුම්කර ශේෂය | - | 962,908 |
| ලියා හල ණයහිමි ශේෂය | - | 55,384 |
| පොදු | 22,157 | 996,738 |
| | 6,825,266 | 7,284,562 |

## 04 සටහන

| පරිපාලන වියදම් | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---:|---:|
| වැටුප් හා වේතන | 45,929,918 | 40,873,836 |
| අනියම් සේවක වැටුප් | 744,425 | 1,823,311 |
| ජීවන වියදම් දීමනාව | 8,640,991 | 8,808,692 |
| ගමන් වියදම් දිරිදීමනා | 11,352,742 | 10,788,046 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 18% | 9,418,170 | 8,905,113 |
| අතිකාල | 12,394,981 | 12,028,101 |
| පැමිණීමේ දිරිදීමනාව | 7,288,210 | 5,618,751 |
| නිෂ්පාදන දිරිදීමනාව | 8,905,242 | 9,864,934 |
| වාර්ෂි ප්‍රසාද දීමනා | 5,984,882 | 2,249,597 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 2,248,339 | 1,594,837 |
| සේවක පොළී පිරිවැය | 2,767,859 | 3,162,554 |
| සේවාමුර දිරිදීමනාව | 1,248,600 | 366,510 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 1,598,875 | 1,394,652 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 2,589,490 | 3,277,181 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 2,254,246 | 2,931,395 |
| වැඩ බැලීමේ දීමනා | 255,000 | 114,000 |
| දුෂ්කර සේවා දීමනාව | 466,665 | 442,455 |
| වෘත්තියවේදී ගාස්තු | 804,000 | 886,097 |
| විශේෂ වැඩ බැලීමේ දීමනාව | 81,000 | 162,000 |
| විශ්‍රාම දීමනා | 208,000 | 116,000 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 798,926 | 668,683 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමයේ වාරිකය | 5,591,304 | 5,446,523 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 16,148,906 | 15,418,180 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 287,308 | 3,909,105 |
| නිල ඇඳුම් හා පාවහන් | 735,111 | 910,978 |
| ගමන් බිමන් - විදේශ | (100,000) | 3,067,064 |
| අධ්‍යක්ෂ ගාස්තු | 172,500 | 108,100 |
| වෙනත් දිරිදීමනා | 1,699,950 | 1,940,570 |
| වරිපනම් හා බදු | 324,333 | 315,843 |
| විදුලිය | 11,299,174 | 11,185,773 |
| ජල ගාස්තු | 1,043,015 | 682,690 |
| රක්ෂණය - පොදු | 795,608 | 425,255 |
| රක්ෂණය - වාහන | 710,937 | 1,073,601 |
| මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 4,713,093 | 5,166,774 |
| වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 4,007,578 | 3,089,772 |
| උපකරණ නඩත්තුව | 1,045,792 | 1,229,907 |
| නඩත්තු පරිපාලන | 5,480,676 | 3,030,083 |
| ගොඩනැගිලි නඩත්තු | 4,093,154 | - |
| ක්ෂය | 25,475,242 | 23,698,255 |
| ප්‍රවාහන ගාස්තු | 810,526 | 1,714,966 |
| තැපැල් හා ෆැක්ස් ගාස්තු | 158,536 | 257,513 |
| දුරකථන ගාස්තු | 1,065,560 | 1,191,102 |
| ආරක්ෂක ගාස්තු | 1,640,881 | 1,560,418 |
| පරිත්‍යාග | 7,181,816 | 6,278,925 |
| බලපත්‍ර ගාස්තු - මෝටර් වාහන | 90,338 | 118,020 |
| බලපත්‍ර ගාස්තු - ඖෂධ | 6,471,837 | 5,515,114 |
| බලපත්‍ර ගාස්තු - වෙනත් | 127,204 | 42,428 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 4,112,674 | 4,504,305 |
| කාර්යාල වියදම් | 360,177 | 476,878 |
| විගණන ගාස්තුව | 1,333,964 | 1,272,945 |
| කුලී ගාස්තු | 961,862 | 8,442,884 |
| ප්‍රචාරක දැන්වීම් | 3,833,320 | 4,904,805 |
| වෙළඳ දායකත්වයන් හා වාර සඟරා | 57,030 | 259,310 |
| නීති හා පරීක්ෂණ වියදම් | 1,161,523 | 1,520,529 |
| වෘත්තීයවේදී ගාස්තු | 470,195 | 1,449,315 |
| සංග්‍රහ වියදම් | 661,118 | 1,007,665 |
| වාර්ෂික දායකත්වයන් | 112,500 | 261,335 |
| වාර්ෂික සම්මන්ත්‍රණ හා රැස්වීම් | - | 11,500 |
| මුද්දර ගාස්තු | 43,750 | 46,950 |
| හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය | 3,122,097 | 59,400 |
| සමාරම්භක උත්සවය සඳහා වියදම් | 3,798,296 | 14,495 |
| පුහුණු පාසල සඳහා වියදම් - CTPPM | - | 8,180 |
| තොග ගණන් ගැනීමේ ගැලපුම්-ලිපි ද්‍රව්‍ය | 58,384 | - |
| | 247,137,830 | 237,694,200 |

05 සටහන

| අලෙවි හා බෙදාහැරීම් වියදම් | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| ප්‍රවර්ධන වට්ටම් | 46,088,517 | 39,756,512 |
| විකුණුම් ප්‍රවර්ධන වියදම් | 7,875,743 | 54,601,236 |
| ප්‍රතික්ෂේපිත නිමි ද්‍රව්‍ය පිරිවැය | 3,383 | 2,234 |
| අඩමාණ ණය | (4,830,000) | 4,830,000 |
| | 49,137,643 | 99,189,983 |

06 සටහන

| වෙනත් මෙහෙයුම් වියදම් | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| සංයෝජන, පර්යේෂණ හා සංවර්ධන වියදම් | 10,320,258 | 8,567,890 |
| තොග ගණන් ගැනීමේ ගැලපුම් - පර්යේෂණ හා සංවර්ධන වියදම් | 156,809 | (43,594) |
| විනිමය අලාභ | 229,599 | 1,997,179 |
| | 10,706,666 | 10,521,475 |

07 සටහන

| මූල්‍ය වියදම් | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| බැංකු ගාස්තු | 472,381 | 389,521 |
| අයිරා පොළිය | 37,335 | 57,603 |
| | 509,716 | 447,124 |

08 සටහන

| මූල්‍ය ආදායම | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය පොළිය | 1,685,580 | 1,434,143 |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය | 87,837,692 | 22,678,826 |
| පොළී ආදායම - කාර්යමණ්ඩල ණය | 4,963,908 | 3,980,172 |
| | 94,487,181 | 28,093,141 |

09 සටහන

| ආදායම් බදු වියදම | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| වත්මන් බදු වියදම - 09 'අ' සටහන | 166,351,979 | 83,836,831 |
| විලම්බිත බදු වියදම - 09 'ආ' සටහන | (22,718,557) | 73,442,350 |
| | 143,633,422 | 157,279,181 |

09 'අ' සටහන

| වත්මන් බදු වියදම | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| වර්ෂයේ ලාභය මත බදු - 09 'අ' (i) සටහන | 166,351,979 | 83,836,831 |
| ආදායම් බදු අධි/ඌණ ප්‍රතිපාදනය | - | - |
| | 166,351,979 | 83,836,831 |

09 'ආ'(i) සටහන

| වර්ෂයේ ලාභය මත ආදායම් බද්ද | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| බදු පෙර ලාභය | 1,160,997,739 | 592,057,058 |
| ඉඩදිය නොහැකි වියදම් | 215,793,816 | 210,579,701 |
| ඉඩදිය හැකි වියදම් | (482,020,484) | (480,569,104) |
| බදු නිදහස් ආදායම - භාණ්ඩාගාර බිල්පත් පොළිය | (87,837,692) | (22,678,826) |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය මත ආදායම් බදු සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම | 127,358 | 28,424 |
| තක්සේරු ආදායම | 807,060,737 | 299,417,253 |
| සුදුසුකම් ලබන ගෙවීම් | - | - |
| බදු අය කළ හැකි ආදායම | 807,060,737 | 299,417,253 |
| මෙහෙයුම් ආදායම මත ආදායම් බදු අනුපාතිකය | 18% | 28% |
| පොළී මත ආදායම් බදු අනුපාතිකය | 24% | 0% |
| මෙහෙයුම් ආදායම මත ආදායම් බද්ද | 145,270,933 | 83,836,831 |
| පොළී මත ආදායම් බද්ද | 21,081,046 | - |
| මුළු ආදායම් බද්ද | 166,351,979 | 83,836,831 |

09 'ආ'සටහන

| විලම්බිත බදු | 2020 වර්ෂය සඳහා | 2019 වර්ෂය සඳහා |
|---|---|---|
| වර්ෂයට අදළ විලම්බිත බද්ද හඳුනාගත්/(ලියාහල) | | |
| විලම්බිත බදු බැරකම මත විලම්බිත බදු | 186,430,894 | 214,934,486 |
| විලම්බිත බදු වත්කම් මත විලම්බිත බදු | (19,223,965) | (21,008,053) |
| | | |
| වර්ෂය අවසානයේදී විලම්බිත බදු බැරකම | 167,206,928 | 193,926,433 |
| වර්ෂය ආරම්භයේදී විලම්බිත බදු බැරකම | 193,926,433 | 120,484,083 |
| **වර්ෂය තුළ හඳුනාගත්/(ලියාහල) විලම්බිත බදු** | (26,719,505) | 73,442,350 |

**විලම්බිත බදු ගැලපුම**

| | |
|---|---|
| ආදායම් ප්‍රකාශයෙහි ලාභයට අදාළ බදු | (22,718,557) |
| විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි ගැලපුමට අදාළ බදු | (4,000,947) |
| | (26,719,505) |

## 10 සටහන

දේපළ, පිරියත හා උපකරණ - ක්ෂය වන වත්කම්

### 2020

පිරිවැය

| විස්තරය | 2020.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම්, | වර්ෂය තුළ විකිණීම්, | 2020.12.31 දිනට ශේෂය, | හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12 ), | හානි වූ හා අභාවිත ගැලපු පසු 2020.12.31 දිනට ශේෂය, |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | - | 6,113,388 |
| ඉඩම් | 49,471,918 | - | - | 49,471,918 | - | 49,471,918 |
| ගොඩනැගිලි | 1,220,693,844 | 97,831,795 | - | 1,318,525,639 | - | 1,318,525,639 |
| පිරියත හා යන්ත්‍ර | 2,820,787,974 | (231,000) | - | 2,820,556,974 | (29,731,682) | 2,790,825,292 |
| මෝටර් වාහන | 89,021,800 | - | - | 89,021,800 | | 89,021,800 |
| යතුරුපැදි | 298,640 | - | - | 298,640 | | 298,640 |
| උපකරණ | 194,052,678 | 3,577,117 | (363,200) | 197,266,595 | (27,364,205) | 169,902,390 |
| පරිගණක උපාංග | 21,138,730 | 3,281,268 | (204,725) | 24,215,273 | (195,381) | 24,019,892 |
| ලී බඩු හා සවිකිරීම් | 33,806,347 | 907,066 | (11,300) | 34,702,113 | (493,748) | 34,208,365 |
| පාපැදි හා කරත්ත | 2,999,367 | - | - | 2,999,367 | | 2,999,367 |
| මෙවලම් | 7,708,770 | - | - | 7,708,770 | (1,474,373) | 6,234,397 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | | |
| වාහන නවතා තබන පර්යන්තය | 1,170,063 | 465,450 | - | 1,635,513 | - | 1,635,513 |
| වත්කම්වල මුළු වටිනාකම | **4,447,263,520** | **105,831,696** | **(579,225)** | **4,552,515,991** | **(59,259,389)** | **4,493,256,601** |

ක්ෂය

| විස්තරය | 2020.01.01දිනට සමුච්චිත ක්ෂය, | වර්ෂය සඳහා ක්ෂය, | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය, | හානි වූ හා අභාවිත ගැලපුම්, | 2020.12.31 දිනට ශේෂය, |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| භූමි අලංකරණ වියදම් | 2,040,590 | 60,788 | | - | 2,101,378 |
| ඉඩම් | - | | - | - | - |
| ගොඩනැගිලි | 293,023,963 | 52,840,799 | - | - | 345,864,762 |
| පිරියත හා යන්ත්‍ර | 676,012,884 | 118,159,732 | - | (1,882,668) | 792,289,947 |
| මෝටර් වාහන | 62,793,447 | 5,338,939 | - | - | 68,132,386 |
| යතුරුපැදි | 278,639 | 3,333 | | - | 281,973 |
| උපකරණ | 112,910,580 | 5,654,407 | (343,587) | (100,416) | 118,120,985 |
| පරිගණක උපාංග | 13,181,668 | 3,156,361 | (204,725) | (4,857) | 16,128,447 |
| ලී බඩු හා සවිකිරීම් | 22,201,420 | 1,962,521 | (11,300) | (8,375) | 24,144,265 |
| පාපැදි හා කරත්ත | 614,778 | 596,752 | - | - | 1,211,530 |
| මෙවලම් | 5,774,932 | 162,942 | - | (40,220) | 5,897,653 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | |
| වාහන නවතා තබන පර්යන්තය | 1,170,063 | 1,436 | - | - | 1,171,499 |
| එකතුව | **1,190,002,963** | **187,938,009** | **(559,612)** | **(2,036,536)** | **1,375,344,824** |

ලියාහල අගය

| විස්තරය | 2020.12.31 දිනට ශේෂය, |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| භූමි අලංකරණ වියදම් | 4,012,010 |
| ඉඩම් | 49,471,918 |
| ගොඩනැගිලි | 972,660,877 |
| පිරියත හා යන්ත්‍ර | 1,998,535,345 |
| මෝටර් වාහන | 20,889,414 |
| යතුරුපැදි | 16,667 |
| උපකරණ | 51,781,405 |
| පරිගණක උපාංග | 7,891,446 |
| ලී බඩු හා සවිකිරීම් | 10,064,100 |
| පාපැදි හා කරත්ත | 1,787,837 |
| මෙවලම් | 336,743 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | - |
| වාහන නවතා තබන පර්යන්තය | 464,014 |
| එකතුව | **3,117,911,777** |

### 2019

පිරිවැය

| විස්තරය | 2019.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම්, | වර්ෂය තුළ විකිණීම්, | 2019.12.31 දිනට ශේෂය, | හානි වූ හා අභාවිත ගැලපුම්, | හානි වූ හා අභාවිත ගැලපු පසු 2019.12.31 දිනට ශේෂය, |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | - | 6,113,388 |
| ඉඩම් | 49,471,918 | - | - | 49,471,918 | - | 49,471,918 |
| ගොඩනැගිලි | 991,475,011 | 229,218,833 | - | 1,220,693,844 | - | 1,220,693,844 |
| පිරියත හා යන්ත්‍ර | 2,810,689,964 | 10,098,010 | - | 2,820,787,974 | (26,745,631) | 2,794,042,343 |
| මෝටර් වාහන | 89,021,800 | - | - | 89,021,800 | - | 89,021,800 |
| යතුරුපැදි | 298,640 | - | - | 298,640 | - | 298,640 |
| උපකරණ | 190,702,108 | 3,350,795 | (225) | 194,052,678 | (25,252,470) | 168,800,208 |
| පරිගණක උපාංග | 19,023,245 | 2,431,773 | (316,288) | 21,138,730 | (183,130) | 20,955,600 |
| ලී බඩු හා සවිකිරීම් | 27,219,638 | 6,586,709 | - | 33,806,347 | (485,373) | 33,320,974 |
| පාපැදි හා කරත්ත | 2,260,377 | 738,990 | - | 2,999,367 | - | 2,999,367 |
| මෙවලම් | 7,708,770 | - | - | 7,708,770 | (1,434,153) | 6,274,617 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | | |
| වාහන නවතා තබන පර්යන්තය | 1,170,063 | - | - | 1,170,063 | - | 1,170,063 |
| වත්කම්වල මුළු වටිනාකම | **4,195,154,922** | **252,425,110** | **(316,513)** | **4 ,447,263,519** | **(54,100,757)** | **4,393,162,762** |

ක්ෂය

| විස්තරය | 2020.01.01දිනට සමුච්චිත ක්ෂය, | වර්ෂය සඳහා ක්ෂය, | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය, | හානි වූ හා අභාවිත ගැලපුම්, | 2020.12.31 දිනට ශේෂය, |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| භූමි අලංකරණ වියදම් | 1,979,802 | 60,788 | - | - | 2,040,590 |
| ඉඩම් | - | | - | - | - |
| ගොඩනැගිලි | 245,109,373 | 47,914,590 | - | - | 293,023,963 |
| පිරියත හා යන්ත්‍ර | 556,495,926 | 119,630,473 | - | (113,515) | 676,012,884 |
| මෝටර් වාහන | 57,177,937 | 5,615,510 | - | - | 62,793,447 |
| යතුරුපැදි | 275,306 | 3,333 | | | 278,639 |
| උපකරණ | 107,734,895 | 5,361,455 | (225) | (185,543) | 112,910,582 |
| පරිගණක උපාංග | 11,235,386 | 2,316,319 | (316,288) | (53,750) | 13,181,667 |
| ලී බඩු හා සවිකිරීම් | 20,788,273 | 1,502,771 | - | (89,624) | 22,201,420 |
| පාපැදි හා කරත්ත | 73,309 | 541,469 | - | - | 614,778 |
| මෙවලම් | 5,615,917 | 162,942 | - | (3,928) | 5,774,931 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | |
| වාහන නවතා තබන පර්යන්තය | 1,170,063 | - | - | - | 1,170,063 |
| එකතුව | **1,007,656,187** | **183,109,650** | **(316,513)** | **(446,360)** | **1,190,002,964** |

ලියාහල අගය

| විස්තරය | 2019.12.31 දිනට ශේෂය, |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| භූමි අලංකරණ වියදම් | 4,072,798 |
| ඉඩම් | 49,471,918 |
| ගොඩනැගිලි | 927,669,881 |
| පිරියත හා යන්ත්‍ර | 2,118,029,459 |
| මෝටර් වාහන | 26,228,353 |
| යතුරුපැදි | 20,001 |
| උපකරණ | 55,889,626 |
| පරිගණක උපාංග | 7,773,933 |
| ලී බඩු හා සවිකිරීම් | 11,119,554 |
| පාපැදි හා කරත්ත | 2,384,589 |
| මෙවලම් | 499,686 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | - |
| වාහන නවතා තබන පර්යන්තය | - |
| එකතුව | **3,203,159,799** |

## 11 සටහන

අස්පෘශ්‍ය වත්කම් — 2020

| විස්තරය | 2020.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම්, | වර්ෂය තුළ බැහැර කිරීම්, | 2020.12.31 දිනට ශේෂය, | හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2020.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 21,386,448 | 543,558 | (67,200) | 21,862,805 | - | 21,862,805 |
| වත්කම්වල මුළු වටිනාකම | **21,386,448** | **543,558** | **(67,200)** | **21,862,805** | **-** | **21,862,805** |

ක්ෂය

| විස්තරය | 2020.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2020.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 17,946,046 | 1,413,652 | (67,200) | - | 19,292,498 |
| එකතුව | **17,946,046** | **1,413,652** | **(67,200)** | - | **19,292,498** |

ලියාපදිංචි අගය

| විස්තරය | 2020.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 2,570,308 |
| එකතුව | **2,570,308** |

අස්පෘශ්‍ය වත්කම් — 2018

| විස්තරය | 2019.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2019.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 19,450,888 | 1,963,000 | (27,440) | 21,386,448 | - | 21,386,448 |
| වත්කම්වල මුළු වටිනාකම | **19,450,888** | **1,963,000** | **(27,440)** | **21,386,448** | **-** | **21,386,448** |

ක්ෂය

| විස්තරය | 2019.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | ,විකිණීමට අදාල සමුච්චිත ක්ෂය, | හානි වූ හා අභාවිත ගැලපුම් | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 16,765,950 | 1,207,536 | (27,440) | - | 17,946,046 |
| එකතුව | **16,765,950** | **1,207,536** | **(27,440)** | | **17,946,046** |

ලියාපදිංචි අගය

| විස්තරය | 2019.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 3,440,401 |
| එකතුව | **3,440,401** |

## 12 සටහන

හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය ගැලපුම් — 2020

| විස්තරය | 2020.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය | වර්ෂය තුළ බැහැර කිරීම් | 2020.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| පිරියත හා යන්ත්‍ර | 26,745,631 | 3,217,050 | - | 29,962,681 |
| උපකරණ | 25,252,470 | 2,213,636 | (332,900) | 27,133,205 |
| පරිගණක උපාංග | 183,130 | 12,250 | - | 195,380 |
| ලී බඩු හා සවිකිරීම් | 485,373 | 10,375 | (2,000) | 493,748 |
| මෙවලම් | 1,434,153 | 40,220 | - | 1,474,373 |
| පරිගණක මෘදුකාංග | - | - | - | - |
| | 54,100,757 | 5,493,531 | (334,900) | 59,259,387 |

හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය ගැලපුම් — 2019

| විස්තරය | 2019.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය | වර්ෂය තුළ බැහැර කිරීම් | 2019.12.31 දිනට ශේෂය, |
|---|---|---|---|---|
| පිරියත හා යන්ත්‍ර | 26,628,131 | 117,500 | - | 26,745,631 |
| උපකරණ | 25,065,795 | 186,900 | (225) | 25,252,470 |
| පරිගණක උපාංග | 129,380 | 53,750 | - | 183,130 |
| ලී බඩු හා සවිකිරීම් | 341,690 | 143,683 | - | 485,373 |
| මෙවලම් | 1,430,225 | 3,928 | - | 1,434,153 |
| පරිගණක මෘදුකාංග | - | - | - | - |
| | 53,595,221 | 505,761 | (225) | 54,100,757 |

## 13 සටහන

පෙර ගෙවූ කල් බදු — 2020

| විස්තරය | 2020.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | ,වර්ෂය තුළ බැහැර කිරීම් | 2020.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 4,920,845 | - | - | 4,920,845 |
| එකතුව | **4,920,845** | **-** | **-** | **4,920,845** |

ක්ෂය

| විස්තරය | 2020.01.01දිනට සමුච්චිත ක්ෂය, | වර්ෂය සඳහා ක්ෂය | බැහැර කිරීම් සඳහා සමුච්චිත ක්ෂය | ,2020.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 1,638,602 | 48,989 | - | 1,687,591 |
| එකතුව | **1,638,602** | **48,989** | **-** | **1,687,591** |

ලියාපදිංචි අගය

| විස්තරය | 2020.12.31 දිනට ශේෂය |
|---|---|
| බදු ඉඩම් | 3,233,254 |
| එකතුව | **3,233,254** |

පෙර ගෙවූ කල් බදු — 2019

| විස්තරය | 2019.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | ,වර්ෂය තුළ බැහැර කිරීම් | 2019.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 4,920,845 | - | - | 4,920,845 |
| එකතුව | **4,920,845** | **-** | **-** | **4,920,845** |

ක්ෂය

| විස්තරය | 2019.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | බැහැර කිරීම් සඳහා සමුච්චිත ක්ෂය | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 1,589,613 | 48,989 | - | 1,638,602 |
| එකතුව | **1,589,613** | **48,989** | **-** | **1,638,602** |

ලියාපදිංචි අගය

| විස්තරය | 2019.12.31 දිනට ශේෂය |
|---|---|
| බදු ඉඩම් | 3,282,243 |
| එකතුව | **3,282,243** |

**වසර 99 ක බදු ඉඩම**
නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 99ක බද්දට ඉඩම ලබාගෙන තිබුණි. මුළු බදු වටිනාකම කල්බදු කාල සීමාව ආරම්භයේදී ගෙවා ඇත. සරල මාර්ග ක්‍රමය මත මෙම බදු වටිනාකම ගිණුම්ගත කර ඇත.

14 සටහන

| වෙනත් ජංගම නොවන වත්කම් | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| තැන්පතු | 1,820,000 | 2,460,000 |
| ආරක්ෂක තැන්පතු | 327,321 | 294,426 |
| | 2,147,321 | 2,754,426 |

15 සටහන

| තොග | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 777,915,954 | 572,154,416 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 64,464,660 | 60,345,943 |
| නිමි භාණ්ඩ | 183,679,231 | 108,381,152 |
| නොනිමි වැඩ | 97,995,471 | 140,807,075 |
| මාර්ගස්ථ තොග - අමුද්‍රව්‍ය | 48,338,167 | 35,354,749 |
| ණය පදනම මත ගත් අමුද්‍රව්‍ය | 22,008 | 88,685 |
| තොග - සංයෝජන, පර්යේෂණ හා සංවර්ධන | 7,352,394 | 2,461,861 |
| පිරියත හා යන්ත්‍ර අමතර කොටස් | 155,507,106 | 120,533,694 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 1,424,751 | 1,030,554 |
| ලිපිද්‍රව්‍ය තොග | 1,764,332 | 1,129,562 |
| | 1,338,464,075 | 1,042,287,690 |

16 සටහන

| වෙළඳ ණයගැතියෝ සහ අයවිය යුතු දේ | | 2020.12.31 දිනට | | 2019.12.31 දිනට |
|---|---|---|---|---|
| ණයගැතියෝ - රාජ්‍ය ඖෂධ සංස්ථාව | | 1,685,000 | | 5,067,375 |
| ණයගැතියෝ - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | 42,312,030 | 2,003,016,236 | |
| (-) අඩමාණ ණය සඳහා වෙන් කිරීම් | | - | (4,830,000) | 1,998,186,236 |
| ණයගැතියෝ - බෙදාහැරීම් | | 120,630,754 | | 134,210,410 |
| ආපදා ණය | | 55,729,563 | | 43,768,025 |
| අයවිය යුතු දේ | 26 සටහන | 4,079,679 | | 68,276,775 |
| පාපැදි ණය | | 1,443,329 | | 1,852,773 |
| සේවක ණය | | 3,352,830 | | 2,239,216 |
| ආර්ථික සේවා බදු - 0.5% | | - | | 28,155,668 |
| උත්සව අත්තිකාරම් | | 528,000 | | 573,000 |
| ආනයන තැන්පතු ආපසු ලැබීම් | | 872,500 | | 704,500 |
| උපයන විට ගෙවන බදු | | - | | 76,626 |
| | | 230,633,684 | | 2,283,110,605 |

17 සටහන

| පූර්ව ගෙවීම් | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | 1,600,017 | 1,305,651 |
| අත්තිකාරම් ගෙවීම් - යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් | 1,036,428 | 7,683,948 |
| පූර්ව ගෙවීම් | 5,732,682 | 6,541,712 |
| කාර්යමණ්ඩලයට කළ පූර්ව ගෙවීම්වල පිරිවැය | 3,632,719 | 5,634,206 |
| | 12,001,846 | 21,165,516 |

18 සටහන

| වෙනත් මූල්‍ය වත්කම් | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 2,960,815,874 | 377,030,073 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් | 79,501,094 | 73,765,864 |
| භාරකාරත්ව අරමුදල තුළ ආයෝජන | - | 24,188,569 |
| | 3,040,316,968 | 474,984,506 |

**භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය**

භාණ්ඩාගාර බිල්පත් වර්ගීකරණය කර ඇත්තෙ ජංගම වත්කමක් ලෙස වන අතර මිනුම් කරනු ලබන්නේ ක්‍රමක්ෂය පදනමටය. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රජයේ බැංකු (ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව) සමග පමණක් REPO පවත්වාගෙන යනු ලබයි.

19 සටහන

| අත ඇති හා බැංකුවේ ඇති මුදල් | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| ලංකා බැංකුව - රත්මලාන ශාඛාව | 53,584 | 6,910 |
| ලංකා බැංකුව - ආයතනික ශාඛාව | 192,301 | 327,273 |
| මහජන බැංකුව - රත්මලාන ශාඛාව | 136,590 | 36,590 |
| මහජන බැංකුව - ආයතනික ශාඛාව | 111,546 | 48,698 |
| අතැති මුදල් | 43,020 | 19,787 |
| සුළු මුදල් | 17,410 | 10,010 |
| | 554,452 | 449,269 |

20 සටහන

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

ප්‍රකාශිත ප්‍රාග්ධනය සෑදී ඇත්තේ රුපියල් 476,904,000 ක් වටිනා රුපියල් 0.186 බැගින් පරිවර්තනය කරන ලද ජපන් යෙන් මිලියන 2564 ක ප්‍රදානයකින්, මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් රුපියල් 208,375,000 ක මුදලකින් සහ රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් පවරන ලද ඉඩම්වල වටිනාකම වූ රුපියල් 4,800,000 කින්ය.

21 සටහන

| විලම්බිත බදු බැරකම | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | 193,926,433 | 120,484,083 |
| වර්ෂය තුල විලම්බිත බදු බැරකම - හඳුනාගත්/(ලියාහල) අගය | (26,719,505) | 73,442,350 |
| | 167,206,928 | 193,926,433 |

22 සටහන

JICA - ණය

උපකරණ ප්‍රසම්පාදනය, සැලසුම් සේවා, ගොඩනැගිලි අළුත් වැඩියාව සහ ඉදිකිරීම් ස්ථාපනය සඳහා වූ ජපන් යෙන් 1,239,888,000 ක JICA ණය අරමුදල් ව්‍යාපෘතිය පහත විස්තර කර ඇත.

| | ජපන් යෙන් |
|---|---|
| විදේශයෙන් සපයන ලද දේපළ පිරියත හා උපකරණ | 910,075,230 |
| සැලසුම් සේවා | 3,216,529 |
| ගොඩනැගිලි අළුත් වැඩියාව සහ ඉදිකිරීම් | 312,850,251 |
| ස්ථාපනය සහ වෙනත් වියදම් | 13,745,990 |
| එකතුව | 1,239,888,000 |

**ණය ආපසු ගෙවීම**

ආපසු ගෙවීමේ කාලය - වසර 10ක සහන කාලය ඇතුළුව වසර 40 කි.

23 සටහන

| වෙළඳ ණයහිමියෝ හා අනෙකුත් ගෙවීම් | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| ණයහිමි පාලනය - ඇසුරුම් ද්‍රව්‍ය | 7,011,215 | 8,970,342 |
| ණයහිමි පාලනය - අමුද්‍රව්‍ය | 31,256,125 | 25,516,476 |
| ණයහිමි පාලනය - ලිපිද්‍රව්‍ය | 3,457,873 | 1,514,237 |
| ණයහිමි පාලනය - උපකරණ හා යන්ත්‍රසූත්‍ර | 1,614,662 | 1,356,714 |
| ණයහිමි පාලනය - රසායනික ද්‍රව්‍ය | 83,198 | 734,594 |
| ණයහිමි පාලනය - පොදු | 114,953,245 | 150,185,427 |
| ණයහිමි පාලනය - බැංකු | 38,958,021 | 37,212,266 |
| ණයහිමි පාලනය - සේවක | 3,863,194 | 3,517,379 |
| ණයහිමි පාලනය - සේවා | 6,068,224 | 5,738,382 |
| ණයහිමි පාලනය - අනෙකුත් ස්ථාවර වත්කම් | 61,324 | - |
| ණයහිමි පාලනය - බද්ධ ව්‍යාපාර | 459,679,854 | 724,794,070 |
| තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු - අයකැමියෝ | 10,388 | 1,003 |
| තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු - ගබඩා සහකාරවරු | 316,933 | 293,422 |
| ගෙවිය යුතු ටෙන්ඩර් බැඳුම්කර | 9,679,678 | 4,824,011 |
| වැන්දඹු හා අනත් දරු අරමුදල වෙනුවෙන් දායක මුදල | 11,387 | |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක හා භාරකාර දායක මුදල් 28% | - | - |
| රක්ෂණ හිමිකම් පාලනය | 8,000 | - |
| වැටුප් පාලන | - | 53,774 |
| | 677,033,320 | 964,712,096 |

## 24 සටහන

### විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි හඳුනා ගනු ලැබූ මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| | 2020.12.31 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| වර්ෂය මුලදී ශුද්ධ බැරකම් | 75,028,761 | 67,741,454 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 6,415,695 | 4,343,654 |
| පොළී පිරිවැය | 8,065,592 | 8,467,682 |
| අතීත සේවා පිරිවැය | - | - |
| උපකල්පන වෙනස්වීම් නිසා වූ ලාභ / අලාභ | - | - |
| ආයුගණක ලාභ / අලාභ | 22,227,485 | 2,182,882 |
| | 111,737,533 | 82,735,672 |
| අඩු කළා | | |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | (4,937,725) | (7,706,911) |
| | 106,799,808 | 75,028,761 |

සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැරකම ඇක්චරියල් සහ මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් පුද්ගලික සමාගම විසින් කරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ඇත. විශ්‍රාම ප්‍රතිලාභයේ පිරිවැය නිර්ණය කිරීමෙහිලා භාවිතා කරන ලද ප්‍රධාන අනුමානයන් වූයේ:

| | | |
|---|---|---|
| අපේක්ෂිත අනාගත වැටුප් වැඩි වීම | 4% | 4% |
| වට්ටම් අනුපාතිකය | 9% | 10.75% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | 1.4% | 1.00% |

ආදායම් ප්‍රකාශ තුළ හඳුනා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| වර්තමාන පාරිතොෂික පිරිවැය | 6,415,695 | 4,343,654 |
| පොළී පිරිවැය | 8,065,592 | 8,467,682 |

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයේ වත්මන් වටිනාකම නිවැරදි ලෙස තක්සේරු කිරීම පිණිස ආයුගණක තක්සේරුවක් සිදු කෙරුණි.

## 25 සටහන

### සම්බන්ධිත පාර්ශව අනාවරණයන්

සැලකිය යුතු සම්බන්ධිත පාර්ශව අනාවරණයන්හි විස්තර පහත පරිදි වේ:

| සංවිධානය | සබඳතාවය | ගනුදෙනුවේ ස්වභාවය | වර්ෂය තුළ විකිණීම් |
|---|---|---|---|
| වෛද්‍ය සැපයුම් අංශය | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 6,639,204,104 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - බෙදාහරින්නන් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 121,821,948 |
| - ටෙන්ඩරපත් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 6,602,500 |
| බෙදාහරින්නන් | | | 880,060,245 |
| | | | 7,647,688,798 |

## 26 සටහන

### ලැබිය යුතු

ලැබිය යුතු දේ පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි වේ.

| | |
|---|---|
| තියෝෆිලීන් ඈන්හයිඩ්‍රස් USP සඳහා නින්ග්බො ජොයිකෙම් වෙතින් ලැබිය යුතු මුදල | 726,780 |
| රක්ෂණය සංස්ථාවෙන් MC Cellulose කි. ග්‍රෑ. 60 සඳහා ලැබිය යුතු මුදල | 70,973 |
| Maize Starch කි. ග්‍රෑ. 4850සඳහා වේ ලින්ක් ඉන්ටනැෂනල් ආයතනය වෙතින් ලැබිය යුත මුදල | 773,753 |
| රසායනික ද්‍රව්‍ය සඳහා VWR (Pvt) LTD වෙතින් ලැබිය යුතු මුදල | 73,007 |
| E/H Gelatin Caps කි. ග්‍රෑ. 1.79 සඳහා ආයුර්වේද සංස්ථාව වෙතින් ලැබිය යුතු මුදල | 2,435,165 |
| එකතුව | **4,079,679** |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

සභාපති

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | විස්තරය |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 06 (2) (අ) වගන්තිය | සේවකයා සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප හෝ වේතනය මත පදනම්ව සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කළ යුතු වුවද, ඒ වෙනුවට සේවකයාගේ සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගෙන සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගොස් තිබුණු නිලධාරීන් 05 දෙනෙකු වෙත පාරිතෝෂික දීමනා ලෙස රු.මිලියන 2.46 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ආ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 103, 104 හා 105 | 2020 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි පිරිවැය රු.5,959,483 ක්වූ අමු ද්‍රව්‍ය තොග, පිරිවැය රු.6,030,600 ක්වූ නොනිමි ද්‍රව්‍ය තොග, පිරිවැය රු.3,383 ක්වූ නිමි ද්‍රව්‍ය තොග හා මුළු පිරිවැය රු.59,259,389 ක්වූ ස්ථාවර වත්කම් ඒකක 346 ක් විධිමත් ලෙස අපහරණය කිරීමටද, භාවිතයට ගත නොහැකි තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමට හා අදාළ පරිදි අලාභය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2020 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී 03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එක් සේවකයෙකු වෙත වාර්ෂිකව රු.13,500 ක් පමණක් ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැකි වුවද, සංස්ථාව විසින් ඊට අමතරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එක් සේවකයෙකුගේ මසක වැටුප විශේෂ ප්‍රසාද දීමනාවක් ලෙසද, එක් සේවකයෙකුට රු.5,000 ක් හෝ රු.10,000 ක් බැගින් සභාපති ප්‍රසාද දීමනාවක් ලෙසද ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛයෙන් අනුමත සීමාව ඉක්මවා හා විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසාද දීමනා ලෙස රු.16,577,284 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඈ) 2020 ජූලි 23 දිනැති අංක PED/A/Surplus/1/11(i) දරන භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපිය | සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාරය වෙත පවරා ගෙන තිබුණු භාණ්ඩාගාර අරමුදල් ආයෝජන රු.24,632,603 ක් භාණ්ඩාගාර බදු වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාර දායකත්වය වෙනුවෙන් වෙනත් කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. |
| (ඉ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය | වැඩ බැලීමේ කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 03 කට අධික කාලයක් වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. |
| ( ඊ ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | එක් නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 101 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.12,429,500 ක් ගෙවා තිබුණි. |
| (උ) 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඇමතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | |
| (i) 02-01ඡේදය | සංස්ථාවේ විධායක හා විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය සලකා ප්‍රවාහන දීමනා ගෙවිය යුතු වුවද, දුර ප්‍රමාණය නොසලකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.4,700 ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. 2019 වර්ෂයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව එම මාසික දීමනාව පිළිවෙලින් රු.8,000 ක් හා රු.6,000 ක් දක්වා වැඩිකර ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ii) 02-02ඡේදය | කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස රු.4,000 ක් පමණක් ගෙවිය හැකි වුවද, ඊට අනුකූල නොවන ලෙස 2011 ජූලි 01 දින සිට මාසිකව උපරිමය රු.12,000 කට යටත්ව සමස්ත කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වැඩියෙන් ගෙවා තිබුණු රු.18,999,486 ක්ද ඇතුළුව 2011 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී නිෂ්පාදන දිරි දීමනා ලෙස මුළු එකතුව රු.121,234,241 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (iii) 02-03 ඡේදය | (i) පැමිණීමේ දිරි දීමනා ලෙස මසකට එක් සේවකයෙකුට රු.2,000 ක් පමණක් ගෙවීමට අනුමැතිය ලැබී තිබුණද එය රු.3,500 ක් දක්වා වැඩි කර ගෙවා තිබුණි.<br><br>(ii) පැමිණීමේ දිරි දීමනා ගෙවන්නේ නම් වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු සඳහා මුදල් ගෙවිය නොහැකිවුවද, පැමිණීමේ දිරි දීමනාව ගෙවා තිබුණු සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු වෙනුවෙන් රු.12,475,703 ක් ගෙවා තිබුණි.<br><br>(iii) අවුරුදු හා නත්තල් වෙනුවෙන් වර්ෂයකට එක් අයෙකුට එක් වතාවක් පමණක් රු.6,000 ක තෑගි වවුචර් ලබාදිය හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ස්ථිර සේවකයන්ට රු.25,000 ක් බැගින් හා පුහුණු සේවකයන්ට රු.12,500 ක් බැගින් වූ මුළු වටිනාකම රු.7,325,000ක් වූ තෑගි වවුචර්ද, ඊට අමතරව පාසල් පොත් හා උපකරණ මිලදී ගැනීමට ස්ථිර සේවකයෙකුට රු.12,500 ක් බැගින් හා අනෙකුත් සේවකයන්ට රු.6,250 ක් බැගින් මුළු වටිනාකම රු.4,712,500 ක් වූ තෑගි වවුචර්ද ලබාදී තිබුණි. |
| (iv) 02-06 ඡේදය | යම් සේවකයෙකුට නියමිත සේවාමුර සියල්ලටම පැමිණියහොත් පමණක් රු.1,000 ක මාසික දීමනාවක් ගෙවිය හැකි වුවද, සහභාගී වූ එක් එක් සේවාමුරයක් වෙනුවෙන් විධායක, පුහුණු වන විධායක හා විධායක නොවන සේවකයන්ට පිළිවෙලින් රු.400 ක්, රු.300 ක් හා රු.200 ක් බැගින් වන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රු.6,981,100 ක් සේවාමුර දීමනාව වශයෙන් ගෙවා තිබුණු අතර වැඩිපුර ගෙවා තිබුණු සේවාමුර දීමනාව රු.3,549,100 ක් විය. |

| | | |
|---|---|---|
| (ඍ) | 2015 ජුනි 04 දිනැති අංක BP/30/15 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය | සංස්ථාවේ සේවකයන් සඳහා ගෙවනු ලබන පා පැදි ණය 2015 ජුනි 04 දින සිට රු.3,000 සිට රු.20,000 දක්වා වැඩිකර තිබුණු නමුත් ඒ සඳහා ලබා ගත යුතු භාණ්ඩාගාර අනුමැතිය විගණන දින වන විටත් ලබාගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර තිබුණු ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදුකර තිබුණු වැරදි හා අඩුපාඩු පහතින් දැක්වේ.

(i) තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු අනුමැතියට පෙර සහ ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම සැපයුම්කරු වෙත ඇණවුම් ලබාදීම.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ කමිටු පත් නොකිරීම හා 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා නොකිරීම.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, කාර්ය සාධන සුරක්ෂණ ලබා නොගැනීම.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, රු.500,000 ඉක්මවූ භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹ නොතිබීම.

(v) කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය (PCA 4 ආකෘති පත්‍රය) සැපයුම්කරු වෙතින් ලබා නොගැනීම.

(ආ) විනිවිදභාවයකින් තොරව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සමහර මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමෙන් තොරව ඉදිකිරීම් පිළිබඳ උපදේශකයින් හා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන තිබීම, කොන්ත්‍රාත් අවසන් කළ යුතු දිනයන් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි ගිවිසුම්වලට ඇතුළත් කර නොතිබීම, නිසි අනුමැතියකින් තොරව නිරන්තරයෙන් මූලික සැලසුම් වෙනස් කිරීම, සැලසුම් හා ප්‍රමාණ පත්‍රවලට අනුකූල නොවන ලෙස ඉදිකිරීම් සිදුකිරීම, ඉදිකිරීම් සිදු කිරීමේ අරමුණ වෙනස් වීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වීම මත කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා යාම නිසා කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුළදී වැඩ අවසන් කර ගැනීමට සංස්ථාව අපොහොසත් වීම මෙන්ම කොන්ත්‍රාත්තුව ඉටුකරන කාලය තුළදී සංස්ථාවේ වගකිව යුතු පාර්ශවයන්ගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොවීම ආදී වූ කරුණු හේතුවෙන්

සිව්මහල් පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම, ගුවන් පාලම ඉදිකිරීම, වානේ ව්‍යුහ ගුදම ඉදිකිරීම, Penicillin Zone ගබඩාව Cephalosporin Production අංශය ලෙස පරිවර්තනය කිරීම හා බුලත්සිංහල ගොඩනැගිල්ල නවීකරණය කිරීම වැනි සංස්ථාවේ කොන්ත්‍රාත්වල පරිපාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) Penicillin Zone ගබඩාව Cephalosporin Production අංශය ලෙස පරිවර්තනය කරමින් G කලාපය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.80,510,608 ක් වූ නමුත් 2020 පෙබරවාරි 19 දින වන විට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා නොගෙන මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.11,918,835 කින් ඉක්මවා වැඩ ඉටුකරවා ගෙන තිබුණි.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, කාලච්ඡේදයන් තුළ ඉටුකරගත යුතු ක්‍රියාකාරකම්වල කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන නිර්ණායක (Key Performance Indicators) ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, සංස්ථාව විසින් 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකි විය.

(ii) ක්‍රියාකාරී සැලස්මේ ඇතුළත් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 875.8 ක්වූ ක්‍රියාකාරකම් 91 ක් අතරින් රු.මිලියන 735.9 ක්වූ ක්‍රියාකාරකම් 51 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර හෝ නොතිබුණු අතර ක්‍රියාකාරකම් 14 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණද අවසන් කර නොතිබුණි. දෙපාර්තමේන්තු තුනකට අදාළ කිසිදු ක්‍රියාකාරකමක සමාලෝචිත වර්ෂයේදී ලබා කරගත් භෞතික ප්‍රගතිය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අලෙවි සැලැස්මට අනුව හඳුනාගෙන තිබුණු මුළු නිෂ්පාදන අවශ්‍යතාවය ඖෂධ වර්ග 28 ක ඒකක මිලියන 2,077 ක්වූ නමුත් සත්‍ය නිෂ්පාදනය ඖෂධ වර්ග 24 ක ඒකක මිලියන 1,535 ක් පමණක් විය.

(ii) අලෙවි සැලැස්මට අනුව ඖෂධ වර්ග 17 ක මුළු නිෂ්පාදන අවශ්‍යතාවය ඒකක මිලියන 163 කින් ඉක්මවමින් ඒකක මිලියන 1,206 ක් නිෂ්පාදනය කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී ඉන් ඒකක මිලියන 999 ක් පමණක් අලෙවිකර තිබුණු අතර ඉතිරි වී තිබුණු ඒකක මිලියන 207 න් ඖෂධ අයිතම 3 ක ඒකක මිලියන 3.07 ක් සඳහා 2021 වර්ෂය වෙනුවෙන්ද වෛද්‍ය සැපයුම් අංශය වෙතින් ඇනවුම් ලැබී නොතිබීම නිසා අලෙවි කර ගැනීමට නොහැකිවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ගවල පෙති කුඩා කොටස්වලට කැඩී යාමේ හැකියාව ඉහළ යාම, ඖෂධ පෙතිවල බරෙහි ඇතිවූ විචලතා, අයහපත් පෙනුම හා ඖෂධ පෙති කැඩීමට ඇති වූ අපහසුතා වැනි හේතූන් මත නිෂ්පාදනය අතරමඟ නවතා නැවත නිෂ්පාදනය කිරීමට සිදුවීම හේතුවෙන් වැය වී තිබුණු අතිරේක පිරිවැය රු.2,563,069 ක් විය. සෑම වර්ෂයකදීම නිෂ්පාදන ක්‍රියාවලියේ සිදුවන මෙම අයහපත් තත්ත්වයන් අවම කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ඉකුත් වර්ෂ දෙකකදී හා සමාලෝචිත වර්ෂය තුළදී පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගෙන තිබුණු මුළු පිරිවැය රු.2,042,844 ක් වූ ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 213 ක් 2021 පෙබරවාරි 17 දින වන විටත් භාවිතයකින් තොරව පැවතුණි. ඉන් ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 175 ක් නියමිත ප්‍රමිතියෙන් නොතිබුණු බවද තහවුරු විය.

(ඈ) සංස්ථාවේ ඖෂධ අලෙවිය හා බෙදාහැරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමුද්‍රව්‍ය නොමැතිවීම, යන්ත්‍ර ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, නිෂ්පාදන ක්‍රියාවලියේ පවත්නා තාක්ෂණික දෝෂ ආදී විවිධ හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධවලින් විකුණුම් වටිනාකම රු.මිලියන 1,003 ක්වූ ඖෂධ වර්ග 26 කින් ඒකක මිලියන 570.78 ක ප්‍රමාණයක් සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණු අතර ඉන් විකුණුම් වටිනාකම රු.මිලියන 44.10 ක් වූ Theophy.ER Tab 125mg ඖෂධයෙන් ඒකක මිලියන 30 ක සම්පූර්ණ අවශ්‍යතාවයම සැපයීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී විකුණුම් වටිනාකම රු.මිලියන 616 ක්වූ ඖෂධ වර්ග 28 ක ඒකක මිලියන 549 ක දේශීය වෙළඳපල අලෙවි ඉලක්කයන් සපුරාගත නොහැකිවී තිබුණ අතර ඉන් විකුණුම් වටිනාකම රු.මිලියන 3.92 ක් වූ ඒකක මිලියන 5.21 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු ඖෂධ අයිතම 02 කින් කිසිදු ප්‍රමාණයක් අලෙවි කිරීමට නොහැකිවී තිබුණි.

(ඇ) දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හිදී ගිවිසුම් ගතවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම බද්ධ ව්‍යාපාර සමඟ සංස්ථාව ගනුදෙනු සිදුකර තිබුණු ආකාරය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආයෝජකයින් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා ගිවිසුම් ගතවී තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විට ආයෝජකයින් තිදෙනෙකුගෙන් පමණක් ඖෂධ මිලදී ගෙන තිබුණි.

(ii) බද්ධ ව්‍යාපාර පිහිටුවීම පිණිස වූ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටු නිර්දේශය ප්‍රකාරව, සංස්ථාව විසින් ඖෂධ සැපයීම සඳහා ගිවිසුම් ගත විය යුත්තේ එම ඖෂධ නිෂ්පාදකයා (Producer) සමඟ විය යුතු වුවද, නිෂ්පාදකයෙක් නොවූ අතරමැදි සැපයුම්කරුවෙකු පමණක් වූ ආයෝජකයෙක් සමඟ ගිවිසුම් ගතවී සැපයුම් භාරගෙන තිබුණි.

(iii) බද්ධ ව්‍යාපාර ගිවිසුම අනුව ආයෝජකයා විසින් නිෂ්පාදනය කරන ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍යවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20 ක ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කළ යුතු විය. සමාලෝචිත වර්ෂය තුළදී එවැනි එක් ආයෝජකයෙකුගෙන් සපයාගෙන වෛද්‍ය සැපයුම් අංශයට අලෙවිකර තිබුණු ඖෂධ අයිතම 06 ක මුළු නිෂ්පාදන පිරිවැය රු.823,010,169 ක්වී තිබුණි. ඊට රු.129,898,488 ක ලාභ එකතුකර ඉන්වොයිස් වටිනාකම රු.952,908,656 කට සංස්ථාව වෙත සපයා තිබුණි. සංස්ථාව විසින් එම ඉන්වොයිස් වටිනාකමට තවත් රු.66,692,327 ක සේවා ගාස්තු එකතු කර රු.1,019,600,983 කට වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණි. එම ඖෂධ 06 හි මුළු පිරිවැයෙන් සියයට 16 ක ලාභ ආන්තිකයක් ආයෝජකයා විසින්ද ඉන්වොයිස් මිලෙන් සියයට 7 ක සේවා ගාස්තුවක් සංස්ථාව විසින්ද උපයා තිබුණි. ඒ අනුව මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 23 ක් ලාභ හා සේවා ගාස්තු වශයෙන් එකතුකර විකුණුම් මිල තීරණය කර තිබුණි.

(iv) බද්ධ ව්‍යාපාර වෙතින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු ඖෂධ අයිතම 43 කින් ඖෂධ අයිතම 36 ක් සඳහා පමණක් සංස්ථාව විසින් තත්ත්ව පරීක්ෂාවන් සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතමයන් 03 ක් මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණද එම ද්‍රව්‍යයන්හි තත්ත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සංස්ථාව සතු නොවීම හේතුවෙන් සැපයුම්කරුවන් විසින්ම එක් එක් නිෂ්පාදන කාණ්ඩවල සාම්පල් කාර්මික තාක්ෂණික ආයතනය (ITI) වෙත යොමු කර තිබුණු අතර එම ආයතනයෙන් නිකුත් කරන පරීක්ෂණ වාර්තා අනුව පමණක් ඖෂධවල තත්ත්වය තහවුරු කර තිබුණි. ඒ අනුව බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධවල ගුණත්වය පිළිබඳ ප්‍රමාණවත් ස්වාධීන තහවුරුවක් සිදුවී නොතිබුණි.

(ඉ) පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීමේ අරමුණින් මුළු මුදල රු.133,767,599 ක් වැයකර මිලදී ගෙන නවීකරණය කර තිබුණු ගොඩනැගිල්ලක් 2019 අගෝස්තු 20 දින සිට 2021 පෙබරවාරි 19 දින වන විටත් නිශ්කාර්යව වසා දමා තිබුණු අතර රසායනාගාරය සහ පුහුණු පාසලක් පිහිටුවීම සඳහා සපුරාලිය යුතු අනෙකුත් අවශ්‍යතා කිසිවක් සඳහා සංස්ථාවේ පෙර සැලස්මක් හෝ සූදානමක් නොතිබීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබුණි.

(ඊ) ගොඩනැගිලි දෙකක් යා කෙරෙන යෝජිත ගුවන් පාලම ඉදිකිරීම සඳහා 2021 පෙබරවාරි 18 දින වන විට රු.6,016,902 ක් වැය කර තිබුණු නමුත් මෙහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට පාලන අධිකාරිය තීරණය කර තිබුණු බැවින් වැයකර තිබුණු මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(උ) සිව් මහල් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ආරම්භක භූගත Piling වැඩ රු.28,952,527 ක වියදමින් 2018 මාර්තු 07 දින වන විට අවසන් කර තිබුණු නමුත් 2021 ජූලි 31 දින වන විටත් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඌ) දෙමහල් ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 සැප්තැම්බර් 21 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර 2021 පෙබරවාරි 19 දින වන විට මේ සඳහා රු.36,045,249 ක් වැය කර තිබුණි. මූලික ගිවිසුම ප්‍රකාරව 2019 අගෝස්තු 21 දින වන විට ඉදිකිරීම් නිම කළ යුතු වුවද 2021 පෙබරවාරි 19 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත් සැලසුම් කළ ධාරිතාවයට ප්‍රමාණවත් ව්‍යුහයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකර නොතිබීම හේතුකොට ගෙන ගොඩනැගිල්ලේ ව්‍යුහය නැවත සමාලෝචනය කිරීම සඳහා 2020 ඔක්තෝබර් 06 දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) වෙත දැනුම් දී තිබුණි.

(එ) මිලදී ගෙන තිබුණු ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 3,105.25 ක් හා ඇසුරුම් ද්‍රව්‍ය තොග ඒකක 292,938 ක් විවිධ හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් රු.3,429,299 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඒ) සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 353 ක් වූ අතර නත්‍ය සේවක සංඛ්‍යාව 302 ක් ද පුරප්පාඩු සේවක සංඛ්‍යාව 67 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 16 ක්ද විය. පුරප්පාඩු පවතින විධායක තනතුරු 06 ක් ඇතුළුව අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට හා අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සංස්ථාවේ ඖෂධ නිමාකිරීමේ සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව ප්‍රසිද්ධ දැන්වීමක් හෝ පුවත්පත් දැන්වීමක් මගින් අදාළ තනතුර සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකින් සුදුසුකම් ලත් නිලධාරීන් බඳවාගත යුතු වුවද, යථෝක්ත ක්‍රියාපටිපාටියෙන් බැහැරව සංස්ථාව වෙත සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගේ සම්බන්ධීකරණ ලේකම් වෙතින් ලද අයදුම්කරුවන්ගේ අයදුම්පත් අතරින් නිලධාරීන් 17 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# 2020 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

2.2.2 (අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව කටයුතු කරනු ඇත.

2.2.2 (ආ) **අමුද්‍රව්‍ය තොග** - අපහරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අපහරණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත

**නොනිමි තොග** - අපහරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 31.08.2021 දින ලැබී ඇත. ඒ අනුව අපහරණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ අංශ වෙත දන්වා ඇති අතර පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපහරණය කිරීමට දිනයක් නියමකර ගත නොහැකි විය. (එම ද්‍රව්‍ය පුත්තලමේ පවතින "Incee Cement" කර්මාන්ත ශාලව වෙත යැවිය යුතුය.)

**ස්ථාවර වත්කම්** - අප ආයතනය මඟින් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සියළු කටයුතු සිදු කිරීමට ස්ථාවර වත්කම් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව මඟින් ස්ථාවර වත්කම් වල තත්ත්වය, ඒවායේ ආයු කාලය නැවත භාවිතා කරන වත්කම් හා ඵලදායී නොවන වත්කම් යනාදිය හඳුනා ගනු ලබන අතර එසේ ඵලදායි නොවන වත්කම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**නිමි ද්‍රව්‍ය තොග** - 2020.12.31 වන දිනට ඇති භාවිතයට ගත නොහැකි නිමි ද්‍රව්‍ය තොගය වන Diclofenac Tablets 50mg (Blister) ඇසුරුම් 41 ක, ඒවායෙහි පෙනුම (appearance) වෙනස්වීම හේතුවෙන් අලෙවි නියෝජිතයකු විසින් ආපසු බාරදී ඇති අතර මෙම ප්‍රමාණය 2021 වසර තුළ අපහරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරනු ලබයි.

2.2.2 (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව කටයුතු කරනු ඇත.

2.2.2 (ඈ) 2020 වර්ෂය සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර දායකත්වයක් සඳහා ලිඛිතව කිසිඳු ඉල්ලීමක් කර නොමැත. නමුත් රාජ්‍ය ව්‍යාපාර ආයතනයක් වශයෙන් භාණ්ඩාගාරය සඳහා අරමුදල් දායකත්වයක් ලෙස සංස්ථාව සතු භාරකාර අරමුදල උපචිත පොලියද ඇතුලත්ව රු.24,632,603 ක මුදලක් භාණ්ඩාගාරය වෙත යවා ඇත.මීට අමතරව කිසිඳු ඉල්ලීමක් නොකිරීම හේතුවෙන් අවසන් ගිණුම් සඳහා වෙන්කිරීමක් කර නොමැත.මෙම වියදම අවසන් මූල්‍ය වාර්තා තුල භාණ්ඩාගාර දායකත්ව වියදමක් ලෙස සටහන් කර ඇති අතර එය වාර්ෂික වාර්තා පිළියෙල කරනවිට විශේෂ බදු වියදමක් ලෙස වෙනස්කර ඇත.

2.2.2 (ඉ) අවස්ථා කීපයකදීම එම තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවූවත්, සුදුසුකම් සැපිරූ කිසිඳු අයදුම්කරුවෙක් අයදුම්කර නොතිබුණි. නැවතත් අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සකසමින් පවතී.

වැඩ බැලීම වෙනුවෙන් ගෙවා ඇති සියලුම ගෙවීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ගෙවා ඇති අතර මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නැවතත් කරුණු ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ.

2.2.2 (ඊ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 (ආපදා ණය සම්බන්ධයෙන්) විශේෂයෙන්ම අදාළ වන්නේ රජයේ දෙපාර්තමේන්තු වැනි රාජ්‍ය ආයතන සඳහා වේ. එසේම රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වැනි සංස්ථා මණ්ඩල සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අදාල වේ.

එමෙන්ම ආපදා ණය සම්බන්ධයෙන් සැලකීමේදී ඉහත චක්‍රලේඛයේ සඳහන් ණය සීමාව ඉක්මවා ලබා දීම මගින් ආයතනයට කිසි ලෙසකින් හෝ පාඩුවක් සිදු වී නොමැත. මන්ද යත් දැනට ආයතනය සතු අතිරික්ත මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරනු ලබන අතර ඒ සඳහා 3.90% ක් වැනි පොළී අනුපාතයක් ලැබෙන අතර ආයතනයේ සේවකයන් හට ආපදා ණය ලබා දීම මගින් 4.20%ක පොළී ආදායමක් ආයතනයට ලැබීම තුළින් ලාභයක්ද ලැබෙනු ඇත. එසේම අදාළ චක්‍රලේඛය විශේෂයෙන්ම හඳුන්වා දී ඇත්තේ රාජ්‍ය ආයතන හෝ විශේෂයෙන්ම ආදායම් උත්පාදනය නොකරන රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා වන අතර ඒවායේ මුදල් නොමැතිකම හේතුවෙන් මෙම සීමා කිරීම් කර ඇති අතර, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වැනි ආදායම් උත්පාදනය කරනු ලබන සහ ලාභ ලබන ආයතනයක මුදල් මෙලෙස ආපදා ණය වශයෙන් ලබා දීම තුළින් ආයතනයටද වාසියක් සිදු වේ.

2.2.2 (උ) (i)

2.2.2 (උ) (ii) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ පරිච්ඡේද 2.3 ට අනුව කටයුතු කරනු ඇත.

2.2.2 (උ) (iii) I

2.2.2 (උ) (iii) ii

2.2.2 (උ) (iii) iii

2.2.2 (උ) (iv)

2.2.2 (ඌ)

2.2.4 (අ) (i) රටේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන්, අමුද්‍රව්‍ය ලබා ගැනීමට තිබූ හදිසි අවශ්‍යතාවය මත මිලදී ගැනීම සඳහා ආවරණ අනුමැතියක් ලබා ගන්නා ලදී. එහිදී විය හැකි අවදානම ද ගණනය කරන ලදී. මෙම මිලදී ගැනීමෙන් කිසිදු අලාභයක් වාර්තා වී නොමැති අතර ඉදිරියේදී සියලු නීති උපරිමයෙන් අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.4 (අ) (ii) ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු දැනටමත් නියමිත ආකෘති පත්‍රයට අනුව සිදු කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ කමිටුව පත්කිරීම සඳහා සංස්ථා සභාපතිතුමාගෙන් ආවරණ අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර ඇත. මේ සියලු කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සැලසුම් හා මිලදී ගැනීම් වෙත දන්වා ඇත.

2.2.4 (අ) (iii) රටේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් අමුද්‍රව්‍ය ලබාගැනීමට තිබූ හදිසි අවශ්‍යතාවය මත මිලදී ගැනීම සඳහා මෙසේ සිදු කරන ලදී. ඉදිරියේදී සියළු නීති උපරිමයෙන් අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.4 (අ) (iv)

2.2.4 (අ) (v)

2.2.4 (ආ) **සිව්මහල් පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම - පැවති අඩු පාඩු නිවැරදි කර ගොඩනැගිල්ල භාවිතයට ගනී.**

<u>**ගුවන්පාලම ඉදිකිරීම -**</u> මෙම ව්‍යාපෘතිය නවතා ලීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

<u>**වානේ ව්‍යූහ ගුදම ඉදිකිරීම**</u>- පැවති අඩු පාඩු නිවැරදි කර ගොඩනැගිල්ල භාවිතයට ගනී.

**<u>Penicillin Zone ගබඩාව Cephalosporin අංශය ලෙස පරිවර්තනය කිරීම -</u>** අදාල කලාපයේ මූලිකව Cephalosporin අයිතම නිෂ්පාදනය කිරීම සඳහා ඉදිකරන ලදි. මෙම කලාපයේ තිබූ විවිධ අඩුපාඩුකම් හඳුනාගෙන ඒවා නිවැරදි කොට මෙම කලාපයේ Thyroxin නිෂ්පාදනය ආරම්භ කර ඇත.

<u>බුලත්සිංහල ගොඩනැගිල්ල නවීකරණය -</u> නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් හා ප්‍රසම්පාදන මගින් මෙම ගොඩනැගිල්ල අයෝජකයෙකුට ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

2.2.4 (ඇ) අදාල කලාපයේ මූලිකව Cephalosporin අයිතම නිෂ්පාදනය කිරීම සඳහා ඉදිකරන ලදි. එහිදී මෙම කලාපයේ තිබූ විවිධ අඩුපාඩුකම් මත උපදේශකවරයාගේ පරීක්ෂාවෙන් පසු තිබූ අඩුපාඩුකම් හඳුනාගත් අතර එහිදී නිරීක්ෂණය වූයේ අදාල අඩුපාඩුකම් නිවැරදි කොට මෙම කලාපයේ Thyroxin ඖෂධය නිෂ්පාදනය කරන ලෙසයි.

මෙහිදී අදාල අඩුපාඩුකම් සකස් කොට නිෂ්පාදනය ආරම්භ කල අතර අමතර වියදම් සඳහා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව තාක්ෂණික කමිටුවේ අනුමැතිය සහ ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ ආවරණ අනුමැතිය ඇතිව ගෙවීම් සිදු කර ඇත. එසේම අදාල සමාගමේ ගෙවීම් ප්‍රමාද වීම නිසා පොලී ප්‍රමාණයක් ඉල්ලා ලිපියක් එවා ඇත. මෙම පොලී ප්‍රමාණය ඉවත් කර ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් සිටී.

3. (අ) (i) 2021 වසරේ සිට PED චක්‍රලේඛනයට අනුව සකස් කිරීමට කටයුතු කරයි.

3. (අ) (ii) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් මෙහි සඳහන් ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීම හෝ ආරම්භ කර අවසන් කිරීමට නොහැකි වූයේ දැනට පවතින ගෝලීය වසංගත තත්ත්වය මත පවතින සෞඛ්‍ය නීති රීති වලට අනුගත වෙමින් සියලුම අවශ්‍යතා ක්‍රියාත්මක වීමට සිදුවීම හේතුවෙනි. මෙම වසංගත තත්ත්වය පහව ගිය පසු ඉහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම කිරීමට බලාපොරොත්තු වේ.

3. (ආ) (i) වාර්ෂික අයවැයගත විකුණුම් ප්‍රමාණයට වඩා අඩුවෙන් සමහර අයිතම නිෂ්පාදනය කර ඇත. ඉල්ලුම වෙනස් වීම, පවතින අමුද්‍රව්‍ය මත සහ තාක්ෂණික ගැටලු වැනි හේතූන් මත මාසික නිෂ්පාදන සැලැස්මද වාර්ෂික නිෂ්පාදන සැලැස්මට වඩා වෙනස් විය හැක.ඒ අනුව වර්ෂය අවසාන වන විට වාර්ෂික පුරෝකථන වල වෙනස්වීම් සිදුවිය හැක.

3. (ආ) (ii) වාර්ෂික අයවැයගත විකුණුම් ප්‍රමාණයට වඩා අඩුවෙන් සමහර අයිතම නිෂ්පාදනය කර ඇත. ඉල්ලුම වෙනස් වීම, පවතින අමු ද්‍රව්‍ය මත සහ තාක්ෂණික ගැටලු වැනි හේතූන් මත මාසික නිෂ්පාදන සැලැස්මද වාර්ෂික නිෂ්පාදන සැලැස්මට වඩා වෙනස් විය හැක. ඒ අනුව වර්ෂය අවසාන වන විට වාර්ෂික පුරෝකථන වල වෙනස්වීම් සිදුවිය හැක.

3. (ආ) (iii) ඉදිරියේදී මෙවැනි ගැටලු ඇති නොවීමට නිෂ්පාදන අංශයට සහය ලබාදීමට කටයුතු කරනු ලැබේ.

3. (ආ) (iv) Flucloxacillin Sodium BP – 200 kg මෙම අමුද්‍රව්‍යයේ පවතින දෝෂයන් නිසා එම අමුද්‍රව්‍ය යොදාගෙන සිදු කරන ලද සියලුම වට්ටෝරු පර්යේෂණ අසාර්ථක විය. මේ බව සැපයුම්කරුට දන්වා යැවූ අතර ඔහු ඒ වෙනුවට හිළවු වශයෙන් තොගයක් එවීමට එකඟ විය. ඒ සම්බන්ධයෙන් කටයුතු ප්‍රසම්පාදන අංශය විසින් කරනු ලැබේ.

3. (ඇ) (i) Theophylline Tab ER 125mg ඖෂධයෙහි 2020 වර්ෂයේදී සැපයීමට නොහැකි වූ මිලියන 30ක ප්‍රමාණයෙන් මිලියන 7.934ක ප්‍රමාණයක් මෙම වසරේදී සපයා ඇති අතර වෛද්‍ය සැපයුම් අංශයේ ප්‍රමාණවත් තොග පැවතීම හේතුවෙන් ඉතිරි මිලියන 22.066ක ප්‍රමාණය සැපයීම තාවකාලිකව අත්හිටු වන ලෙස දැනුම්දී ඇත.

3. (ඇ) (ii) සත්‍ය නිෂ්පාදන ප්‍රමාණය සැලසුම් කළ ප්‍රමාණයට හෝ ඊට වඩා සිදු කර ඇත. මෙසේ සිදුවන වෙනසට ප්‍රධාන ලෙස පහත කරුණු බලපානු ලබයි. නමුත්,එම වර්ෂයෙහි ඉලක්කගත සමස්ථ අලෙවි ආදායම ඉක්මවා අලෙවි ආදායමක් ලබා ගැනීමට අපට හැකි වී ඇත.

3. (ඈ) (i) ඉතිරි විභව ආයෝජකයන් තවමත් නිෂ්පාදනාගාර ඉදිකරමින් සිටී.

3. (ඈ) (ii) මේ වන විට සඳහන්ව ඇති බද්ධ ව්‍යාපාරයේ නිෂ්පාදකයා විසින් ඍජුවම අප ආයතනයට සැපයුම් කරනු ලැබේ.

3. (ඈ) (iii) එකම අයිතමය අප ආයතනය මඟින් සහ බද්ධ ව්‍යාපාර මඟින් නිෂ්පාදනය කරන අවස්ථාවලදී මෙවැනි ගැටලු පැන නගී.

3. (ඈ) (iv) බද්ධ ව්‍යාපාර යටතේ ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය සඳහා ITI (කාර්මික තාක්ෂණික ආයතනය) ආයතනය නිකුත් කරන ලද විශ්ලේෂණ වාර්තාවන්ට අනුව වෛද්‍ය සැපයුම් අංශය වෙත සැපයීම් සිදුකර ඇති අතර කිසිදු පැමිණිල්ලක් මේ සම්බන්ධයෙන් අප වෙත ලැබී නොමැත.

ITI ආයතනයේ පරීක්ෂණාගාර නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන උපකරණ සහ අමුද්‍රව්‍ය මිලදී ගෙන 2022 වර්ෂයේදී ශල්‍ය පරිබෝජන ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ කටයුතු SPMC තත්ත්ව පාලන පරීක්ෂණාගාර තුළ ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

3. (ඉ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් හා ප්‍රසම්පාදන මඟින් මෙම ගොඩනැගිල්ල අයෝජකයෙකුට ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2021.04.09 දින ඉදිරිපත් කර ඇත.

3. (ඊ) මෙම ව්‍යාපෘතිය නවතා ලීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

3. (උ) M/S CECB ආයතනයට අවශ්‍ය වාර්තා ලබා දී ඇති අතර, ඔවුන් විසින් ලබා දෙන Piling Condition Analysis Report' (PCAR) මෙතෙක් ලැබී නැත.


3. (ඌ ) දැනට M/S CECB ආයතනයේ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතිය කෙරීගෙන යන


3. (එ) මෙවැනි අලාභ සිදු නොවීමට අවශ්‍ය අධීක්ෂණයන් මේ වන විට සිදු කරනු ලබයි. මේ පිලිබඳ වයස් විශ්ලේෂණ වාර්තාවක් (Age Analysis Report) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. ලබා දෙන උපදෙස් වලට අනුව කටයුතු කරමින් ඉදිරියේදී මෙවැනි අලාභයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

3. (ඒ) (i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් බඳවා ගැනීමේ පටිපාටි අනුමත වීමට ඇති තනතුරු හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු (PL) හැර පුරප්පාඩුව තිබූ අනෙකුත් තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් අනුව බඳවා ගැනීමේ තරඟ විභාග පවත්වා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම covid 19 වසංගත තත්වය හමුවේ කල් දැමීමට සිදු විය. එහෙත් මේ වන විට බඳවා ගැනීමේ තරඟ විභාග හා සම්මුඛ පරීක්ෂණ පවත්වා විධායක නොවන තනතුරු සඳහා බඳවා ගන්නා ලද අතර විධායක තනතුරු 6 ක් සඳහා ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

3. (ඒ) (ii) Covid 19 වසංගත තත්වය හමුවේ අප සංස්ථාවේ කටයුතු අඛණ්ඩව සිදු කළ අතර ඖෂධ නිෂ්පාදනයද වර්ධනය විය. එහෙත්, නිමි ඖෂධ කඩිනමින් අසුරා වෛද්‍ය සැපයුම් අංශයට හා දේශීය වෙළඳපොළට යොමු කිරීම ඒ හා සමාන්තරව වැඩිදියුණු කර ගැනීමට නොහැකි විය. එයින් ඇසුරුම් කළ යුතු ඖෂධ නිෂ්පාදනාගාරය තුළ තැන් තැන් වල අසුරා තැබීමට පවා සිදු විය. සේවක හිඟතාවය නිසා ඒ වන විට ඇසුරුම් අංශයේ සේවකයින් 12ක ගෙන් ක්‍රියා කරවන එක් නිෂ්පාදන දාමයක්ම අක්‍රීයව පැවතීමයි. මේ බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතද දන්වා යවා සේවක සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ඉල්ලුම් කර තිබුණි. කොරෝනා වසංගත තත්වය නිසා ඒ වන විට පුවත්පත් දැන්වීම් පළ කර සම්මුඛ පරීක්ෂණ පවත්වා සේවකයින් බඳවා ගැනීමට තරම් වාතාවරණයක් රට තුළ නොතිබුණු බැවින් ඒ වන විට පැවති දැඩි සේවක අවශ්‍යතාවය මත එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ අනුමැතිය හා අනුදැනුම මත තාවකාලික පදනමින් දෛනික ගෙවීමකට යටත්ව ඖෂධ නිමාකිරීමේ සහායකයින් 20දෙනෙකු බඳවා ගන්නා ලදී.


# ප්‍රස්ථාරාත්මක සමාලෝචනය








## තත්ත්ව පාලනය


2020 වර්ෂයේ ප්‍රගති විශ්ලේෂණය




## අලෙවිකරණය


2020
13.10
0.09
86.81
වෛ.සැ.අං
රා.ඖ.සං.
බෙදාහැරීම්

## මුල්‍ය


පිරිවැටුම
රු. මිලියන
2011
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
වර්ෂය


ශුද්ධ (ලාභය / අලාභය)
1400
1200
1000
800
600
400
200
0
244.79
329.96
266.48
414.5
442.16
321.98
359.68
592
1160.99
2011
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
වර්ෂය

# පසුගිය වර්ෂ 10 තුළ වැදගත් මූල්‍ය විස්තර

(Rs.000)

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම | 1,431,655 | 1,414,546 | 1,941,182 | 1,712,105 | 2,054,363 | 2,434,508 | 3,174,612 | 4,621,537 | 5,646,878 | 7,647,780 |
| අලෙවි පිරිවැය | 1,127,409 | 1,220,523 | 1,513,899 | 1,319,715 | 1,539,441 | 1,888,256 | 2,666,683 | 3,990,801 | 4,743,125 | 6,280,757 |
| දළ ලාභය | 304,246 | 194,023 | 427,283 | 392,391 | 514,921 | 546,252 | 507,928 | 630,736 | 903,752 | 1,367,023 |
| මෙහෙයුම් ලාභය | 222,469 | 85,292 | 304,176 | 224,758 | 364,845 | 353,776 | 244,781 | 308,741 | 564,411 | 1,067,020 |
| පරිපාලන වියදම | 72,730 | 82,390 | 106,096 | 133,933 | 125,469 | 165,788 | 204,579 | 242,218 | 237,694 | 247,137 |
| පොළී ආදායම | 23,702 | 34,251 | 28,059 | 44,196 | 53,586 | 87,629 | 77,607 | 51,659 | 28,093 | 94,487 |
| බදු පෙර ශුද්ධ ලාභය | 244,792 | 117,136 | 329,968 | 266,481 | 414,501 | 441,164 | 321,982 | 359,680 | 592,057 | 1,160,997 |
| බදු පසු ශුද්ධ ලාභය | 193,029 | 98,561 | 209,154 | 183,848 | 262,323 | 296,646 | 223,907 | 251,262 | 434,777 | 1,017,364 |
| ස්ථාවර වත්කම් | 864,779 | 804,305 | 762,641 | 780,718 | 762,560 | 798,657 | 802,775 | 3,133,903 | 3,203,159 | 4,621,971 |
| කෙටිකාලීන ආයෝජන | 331,779 | 210,691 | 429,896 | 913,443 | 1,027,388 | 1,175,754 | 926,461 | 369,761 | 474,984 | 3,040,316 |
| මුළු වත්කම් | 1,945,347 | 2,003,258 | 2,294,113 | 2,386,449 | 2,700,885 | 2,902,284 | 3,073,471 | 6,229,453 | 7,185,386 | 7,829,711 |
| සේවක සංඛ්‍යාව | 208 | 199 | 211 | 226 | 229 | 248 | 274 | 276 | 276 | 291 |

මුළු වත්කම් = මුළු ජංගම නොවන වත්කම්වල ශුද්ධ ගිණුම්ගත වටිනාකම + මුළු ජංගම වත්කම්

**ලියාපදිංචි කාර්යාලය**

11, සර් ජෝන් කොතලාවල මාවත,
කඳවල වත්ත,
රත්මලාන.

දුරː 2635353, 2637574, 2636966,
2636967 (ADSL)
ෆැක්ස් : 2634771, 2626621, 2623553
වි - තැපැල : spmclanka@sltnet.lk
වෙබ් අඩවිය : www.spmclanka.lk

**සභාපති**
දුර : 2623238 (සෘජු)
2635353, 2714771 (පොදු)

**කළමනාකාර අධ්‍යක්ෂ**
දුර : 2636368 (සෘජු)
2635353, 2637574 (පොදු)

**සාමාන්‍යාධිකාරිණී**
දුර : 3153835 (සෘජු)
2635353, 2637574 (පොදු)

**නිෂ්පාදන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන**
දුර : 2623521 (සෘජු)

**සැලසුම් හා ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**- සැලසුම් හා ප්‍රසම්පාදන**
දුරː 2623298 (සෘජු)

**කළමනාකාරිණී - සැලසුම් හා ප්‍රසම්පාදන**
දුරː 2637124 (සෘජු)

**අලෙවි දෙපාර්තමේන්තුව**
**අලෙවි කළමනාකාරිණී**
දුර : 3163308 (සෘජු)

**තත්ව පාලන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තත්ව පාලන**
දුර : 5012945 (සෘජු)

**වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**- වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන**
දුර : 5012950 (සෘජු)

**මූල්‍ය දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - මූල්‍ය**
දුර : 2626630 (සෘජු)

**මූල්‍ය කළමනාකරු**
දුර : 2623276 (සෘජු)

**නඩත්තු දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු**
දුර : 2623246 (සෘජු)

**කළමනාකරු - ඉංජිනේරු**
දුර : 2623239 (සෘජු)

**අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව**
**අභ්‍යන්තර විගණක**
දුර : 2626619 (සෘජු)

**මානව සම්පත් දෙපාර්තමේන්තුව**
**මානව සම්පත් කළමනාකාරිණී**
දුර : 2636234 (සෘජු)

**பதிவு செய்யப்பட்ட அலுவலகம்**

11,சேர் ஜோன் கொத்தலாவல மாவத்தை,
கந்தவெல எஸ்ரேட்,
இரத்மலானை

தொ.பே.: 2635353, 2637574 , 2636966 , 2636967
(ADSL)
தொலைநகல் : 2634771, 2626621, 2623553
மின்னஞ்சல் : spmclanka@sltnet.lk
வலையமைப்பு : www.spmclank.lk

**தலைவர்**
தொ.பே. : 2623238 (நேரடி)
2635353, 2714771 (பொது)

**முகாமைத்துவ பணிப்பாளர்**
தொ.பே : 2636368
2635353, 2637574 (பொது)

**பொது முகாமையாளர்**
தொ.பே : 3153853 (நேரடி)
2635353, 2637574 (பொது)

**உற்பத்தித் திணைக்களம்**
**உற்பத்தி பொது முகாமையாளர்**
தொ.பே : 2623521 (நேரடி)

**திட்டமிடல், கொள்வனவு, சந்தைப்படுத்தல்**
**திட்டமிடல், கொள்வனவு பொது**
**முகாமையாளர்**
தொ.பே : 2623298 (நேரடி)

**திட்டமிடல், கொள்வனவு முகாமையாளர்**
தொ.பே : 2637124 (நேரடி)

**சந்தைப்படுத்தல் திணைக்களம்**
**சந்தைப்படுத்தல் முகாமையாளர்**
தொ.பே : 3163308 (நேரடி)

**தரக் கட்டுப்பாட்டுத் திணைக்களம்**
**தரக்கட்டுப்பாட்டு பொது முகாமையாளர்**
தொ.பே : 5012945 (நேரடி)

**உருவாக்கல், ஆய்வு, அபிவிருத்தித் திணைக்களம்**
**உருவாக்கல், ஆய்வு, அபிவிருத்தி பொது**
**முகாமையாளர்**
தொ.பே : 5012950 (நேரடி)

**நிதித்திணைக்களம்**
**நிதி பொது முகாமையாளர்**
தொ.பே : 2626630 (நேரடி)

**நிதி முகாமையாளர்**
தொ.பே : 2623276 (நேரடி)

**பராமரிப்புத் திணைக்களம்.**
**பராமரிப்பு பொது முகாமையாளர்**
தொ.பே : 2623246 (நேரடி)

**பராமரிப்பு முகாமையாளர்**
தொ.பே : 2623239 (நேரடி)

**உள்ளகக் கணக்காய்வுத் திணைக்களம்**
**உள்ளகக் கணக்காய்வாளர்**
தொ.பே : 2626619 (நேரடி)

**மனிதவள திணைக்களம்**
**மனிதவள முகாமையாளா**
தொ.பே : 2636234 (நேரடி)

**Registered Office**

11,Sir John Kotelawala Mawatha,
Kandawala Estate,
Rathmalana.

Tel: 2635353 , 2637574 , 2636966 , 2636967(ADSL)
Fax : 2634771,2626621,2623553
email : spmclanka@sltnet.lk
Web : www.spmclanka.lk

**Chairman**
Tel : 2623238 ( Direct )
2635353, 2714771 (General)

**Managing Director**
Tel : 2636368 (Direct)
2635353, 2637574 (General)

**General Manager**
Tel : 3153835 (Direct)
2635353, 2637574 (General)

**Production Dept.**
**DGM Production**
Tel : 2623521 (Direct)

**Planning & Procurement Dept.**
**DGM Planning & Procurement**
Tel : 2623298 (Direct)

**Manager Planning & Procurement**
Tel : 2637124 (Direct)

**Marketing Dept.**
**Manager Marketing**
Tel : 3163308 (Direct)

**Quality Control Dept.**
**DGM Quality Control**
Tel : 5012945 (Direct)

**Formulation, Research & Development Dept.**
**DGM Formulation, Research & Development**
Tel : 5012950 (Direct)

**Finance Dept.**
**DGM Finance**
Tel : 2626630 (Direct)

**Finance Manager**
Tel : 2623276 (Direct)

**Maintenance Dept.**
**DGM Engineering**
Tel : 2623246 (Direct)

**Manager Engineering**
Tel : 2623239 (Direct)

**Internal Audit Dept.**
**Internal Auditor**
Tel : 2626619 (Direct)

**Human Resources Dept.**
**Manager Human Resources**
Tel : 2636234 (Direct)

www.spmclanka.lk